මහජන බැංකුව හා එහි පරිපාලිත සමාගම් - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

මහජන බැංකුවේ (“බැංකුව”) මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ හා එහි පරිපාලිත සමාගම්වල (“සමූහය”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරු වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මුදල් පනතේ 5(1) වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව 1992 මැයි 14 වන දින අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශනයට පත් කර ඇති මුදල් අමාත්‍යවරයාගේ නියෝගයක් මඟින් 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසේ සඳහන් විධි විධාන වලින් බැංකුව නිදහස් කර ඇත.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

බැංකුවේ හා සමූහයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී. ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව හා සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව හා සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුව හා සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා බැංකුව හා සමූහය විසින් පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී . වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා ආයතනවල මූල්‍ය තොරතුරු හෝ සමූහය තුල ව්‍යාපාර ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගන්නා ලදී. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්ය සාධනය සඳහා මා වගකිව යුතු වේ.මාගේ විගණන මතය සඳහා සම්පූර්ණයෙන් මා වගකිව යුතු ය .

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත .

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව බැංකුව ක්‍රියාකර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව; සහ

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

1.5.1 ලැබිය යුතු දෑ

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
1.5.1.1. නිශ්චිතව හඳුනානොගත් ගිණුමේ දිගු කාලීන අයවිය යුතු ශේෂය - අපේක්ෂිත බෙදාහැරීම් සඳහා ගෙවන ලද මුදල (පොදු ලෙජර කේත – 393470) තාක්ෂණික උපකරණ ලබා ගැනීම සඳහා සැපයුම්කරුවන්ට ලබා දුන් අත්තිකාරම්, අපේක්ෂිත බෙදාහැරීම් සඳහා සැපයුම්කරුවන්ට ගෙවන ලද නිශ්චිතව හඳුනානොගත් ගිණුමේ ඇතුළත් වේ. ලබා ගන්නා සේවාවන්හි ස්වභාවය අනුව ව්‍යාපෘති අවසන් වූ පසු මෙම ගිණුමේ ශේෂයන් ප්‍රාග්ධනිත කරනු ලැබේ. 2024 දෙසැම්බර් 31 දිනට මෙම ගිණුමේ මුළු ශේෂය රු. බිලියන 1.6 ක් වන අතර, රු. මිලියන 872 ක ඇතැම් ශේෂයන් වසරකට වැඩි කාලයක් කිසිදු ක්‍රියාමාර්ගයකින් තොරව පවතී. ඉහත ශේෂයෙන් රු. මිලියන 511 ක් 2020 වර්ෂයේ සහ ඊට පෙර කාල පරිච්ඡේද වල සිට ඉතිරිව තිබුණි.	තොරතුරු තාක්ෂණ ආශ්‍රිත ව්‍යාපෘති සඳහා සැපයුම්කරුවන්ට ගෙවන ලද අත්තිකාරම් මෙම ශේෂය නියෝජනය කරයි. 2025 ජුනි 30 දිනට, අයවිය යුතු ශේෂය රු. මිලියන 1,810.4 ක් වන අතර, එයින් රු.මිලියන 427.5 ක් 2020 සහ ඊට පෙර කාල පරිච්ඡේදවලට අදාළ වේ. දිගුකාලීන ව්‍යාපෘති කාලරාමු සහ අපේක්ෂිත ලියකියවිලි නිසා ප්‍රධාන වශයෙන් ප්‍රමාදයන් සිදු වී ඇත. සැපයුම්කරුවන් සහ පරිශීලක දෙපාර්තමේන්තු සමඟ සැසඳීම් සිදුවෙමින් පවතින අතර, ප්‍රාග්ධනිත කිරීම හෝ අයකර ගැනීම හරහා පැරණි අත්තිකාරම් නිරවුල් කරනු ලැබේ. නැවත ඇතිවීම වැළැක්වීම සඳහා ශක්තිමත් පාලනයන් සහ 2025 වසර අවසන් වන විට ශේෂය සැලකිය යුතු ලෙස අඩු කිරීම සඳහා ව්‍යුහගත සැලැස්මක් ක්‍රියාත්මක වේ.	ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සමාලෝචනය කර, නිශ්චිතව හඳුනානොගත් - අපේක්ෂිත බෙදාහැරීම් සඳහා ගෙවන ලද මුදල් ගිණුමේ දිගු කාලීන අයවිය යුතු ශේෂය සැසඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.

1.5.2 ගෙවිය යුතු දෑ

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
1.5.2.1. ස්ථාවර තැන්පතු සමූහයක ගනුදෙනුකරුවන් අනුව පද්ධති වාර්තා නොමැති වීම උතුරු පළාතේ යුද්ධයේදී මියගිය පුද්ගලයින්ට අයත් යැයි විශ්වාස කෙරෙන රු. මිලියන 81.2 ක් පමණ වන ස්ථාවර තැන්පතු සමූහයක් සඳහා ගනුදෙනුකරුවන් අනුව පද්ධති වාර්තා හෝ නිසි ලෙස නඩත්තු කරන ලද අතින් සටහන් කරන ලද වාර්තා බැංකුවේ නොතිබුණි. එම තැන්පතු පොදු ලෙජර අංක 415501 නිශ්චිතව හඳුනානොගත් දේශීය ස්ථාවර තැන්පතු යටතේ වර්ග කර ඇත.	මේ සම්බන්ධයෙන් පහත කරුණු සටහන් කෙරේ. • මුලතිව් (020), පරන්තන් (111) සහ මාන්කුලම් (165) ශාඛා යුද සමයේදී බෝම්බ ප්‍රහාරවලින් විනාශ වූ අතර ශාඛා මට්ටමේ බැංකු ලේඛන සියල්ල නැති විය. • එකල මෙම ශාඛා අතින් සටහන් කිරීමෙන් ක්‍රියාත්මක වූ අතර සෑම මාස හයකට වරක් වන්නි ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයට (RHO) ශේෂ පිරික්සුමක් ඉදිරිපත් කරන ලදී. • යුද්ධයෙන් පසු ශාඛා නැවත ස්ථාපිත කිරීමේදී, ගිණුම් අංකය සහ ශේෂය පමණක් අඩංගු RHO හි තිබූ ශේෂ පිරික්සුමක් මත පදනම්ව, ශේෂයන් පොදු ලෙජර අංක 415501 වෙත බැර කරන ලදී. • මෙම ගිණුම්වල ගිණුම් අංකය සහ ශේෂය පමණක් අඩංගු වන අතර, ගනුදෙනුකරුවන් තම ස්ථාවර තැන්පතු සහතික සහ වලංගු හැඳුනුම්පත ඉදිරිපත් කරන අවස්ථාවක RHO වෙතින් අනුමැතිය ලබා ගැනීමෙන් පසු අදාළ ශාඛාව මෙම ගිණුමෙන් හර කර ගනුදෙනුකරුට අරමුදල් නිදහස් කරයි. • නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා මෙම ශාඛා මඟින් පවත්වාගෙන යනු ලබන ශේෂ පිරික්සුම් වාර්ෂිකව පොදු ලෙජර් පාලනයන් (පොදු ලෙජර් අංක 415501) සමඟ සසඳනු ලැබේ.	ගනුදෙනුකරුවන්ගේ තැන්පතු වල ආරක්ෂාව සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්න.

1.5.3 අත්තිකාරම්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
1.5.3.1. 2024 වර්ෂය තුළ බැංකුව විසින් රු. මිලියන 464,231.8 ක වටිනාකමකින් යුතු ණය 162,721 ක සංඛ්‍යාවක් ප්‍රදානය කර ඇත. ඉහත ප්‍රදානය කරන ලද ණය අතරට ප්‍රතිලේඛණගත කරන ලද රු.මිලියන 9,242.5 ක වටිනාකමකින් යුතු ණය 3,063 ක සංඛ්‍යාවක් ඇතුළත් වේ. 2024 වර්ෂය තුළ ප්‍රදානය කරන ලද ණයවලින් වටිනාකම රු. මිලියන 6,002.4 ක ණය 2,822 ක් 2024 දෙසැම්බර් 31 වන විට අක්‍රීය කාණ්ඩයේ පැවතුනි.රු.මිලියන 5,082.8 ක ප්‍රතිලේඛණගත කරන ලද ප්‍රාග්ධන ණය ශේෂය, රු.මිලියන 847.6 ක ප්‍රතිලේඛණගත කරන ලද පොලී සහ ඒකාබද්ධ ණය ශේෂය සහ රු. මිලියන 72 ක අනෙකුත් ණය ශේෂය ඉහත අයවිය යුතු ශේෂයට ඇතුළත් වේ.	2024 වර්ෂයේදී ලබා දුන් ණය අක්‍රීය කාණ්ඩයට මාරු වීමේ ප්‍රතිශතය සියයට 1.3 ක් වන අතර එය රට තුළ පැවති සාර්ව ආර්ථික තත්ත්වයන් අනුව පිළිගත හැකිය. කෙසේ වෙතත්, ව්‍යුහගත සහ අවධානය යොමු කළ ප්‍රවේශයක් හරහා අක්‍රීය ණය (NPL) අයකර ගැනීමේ ප්‍රමුඛතාවය සහ අවධානය හේතුවෙන්, ගිණුම් ගණන සහ ශේෂය අනුව පෙන්වන ලද අක්‍රීය ණය අඩු කිරීමේ ක්‍රියාවලියක බැංකුව නිරතව සිටී. ඒ අනුව, 2024 වර්ෂය තුළ ලබා දී ඇති ණයවල ප්‍රාග්ධන අයවිය යුතු ශේෂය 2024 දෙසැම්බර් 31 වන දිනට රු.මිලියන 439,727 සිට 2025 ජුනි 30 වන වන විට රු.මිලියන 309,519.66 ක් දක්වා රු.මිලියන 130,207.34 කින් අඩු කර ගැනීමට බැංකුවට හැකි විය. තවද, 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලේඛණගත කරන ලද ණයවල ප්‍රාග්ධන අයවිය යුතු ශේෂය රු.මිලියන 6,002.37 සිට 2025 ජුනි 30 දිනට රු.මිලියන 5,509.04 දක්වා, රු.මිලියන 493.33 කින් අයකර ගැනීමට බැංකුවට හැකි විය.	බැංකුවේ අරමුණු අනුව සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්ට අනුමත මාර්ගෝපදේශ සහ චක්‍රලේඛවලට අනුකූලව ණය සහ අත්තිකාරම් ප්‍රදානය කිරීමට සහ ඵලදායීව සහ කාර්යක්ෂමව අයකර ගැනීමට අවශ්‍ය පියවර ගන්න. තවද, ණය කළඹේ ගුණාත්මකභාවය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්න.
1.5.3.2. 2024 දෙසැම්බර් 31 දිනට බැංකුවේ දළ ණය සහ අත්තිකාරම් රු.මිලියන 1,671,180 ක් ලෙස වාර්තා වූ අතර එය පෙර වසර අවසානයේ ශේෂය වූ රු. මිලියන 1,846,390 හා සසඳන විට රු. මිලියන 175,210 ක් හෙවත් සියයට 9.5 ක අඩුවීමකි.	2025 ජුනි 30 දිනට බැංකුවේ දළ ණය සහ අත්තිකාරම් රු.මිලියන 1,743,682 ක් ලෙස වාර්තා වූ අතර එය 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය වන රු.මිලියන 1,671,180 හා සැසඳීමේදී රු. මිලියන 72,502 ක් හෙවත් සියයට 4.3 ක වැඩිවීමක් සිදුවී ඇත.	
1.5.3.3. 2024 දෙසැම්බර් 31 දිනට කිසිදු වාරිකයක් අයකර නොගත් ණය සහ අත්තිකාරම්වල ප්‍රාග්ධන අයවිය යුතු	2024 දෙසැම්බර් 31 සිට 2025 ජුනි 30 දක්වා මාස 6 ක කාලයක් තුළ ක්‍රියාත්මක කරන ලද වේගවත්	

ශේෂය පහත දැක්වේ.

ප්‍රදානය කළ වර්ෂය	ප්‍රදානය කළ ණය සංඛ්‍යාව	ප්‍රදානිත ප්‍රාග්ධනය රු.මිලියන	2024.12.31 දිනට අයවිය යුතු ප්‍රාග්ධනය රු.මිලියන
2024	201	3,610.0	3,462.7
2023	185	505.8	479.7
2022	94	1,871.8	1,847.0
2021	87	62.9	51.4
	567	6,050.5	5,840.8

අයකර ගැනීමේ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස, කිසිදු වාරිකයක් අයකර නොගත් ණය සහ අත්තිකාරම්වල ප්‍රාග්ධනය අයවිය යුතු ශේෂයෙන් රු.මිලියන 227.17 ක් අයකර ගැනීමට බැංකුවට හැකි වී ඇත. තවද, අයකර ගැනීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතින අතර විස්තර පහත පරිදි වේ.

ප්‍රදානය කළ වර්ෂය	2025.06.30 දිනට අයවිය යුතු ප්‍රාග්ධනය රු.මිලියන	ජනවාරි-ජුනි දක්වා අයකරගත් ප්‍රාග්ධනය රු.මිලියන
2024	3,441.24	21.49
2023	304.88	174.79
2022	1,836.88	10.17
2021	30.72	20.72
	5,613.72	227.17

1.5.3.4. පසුගිය වසර පහ තුළ කපා හරින ලද ශේෂයන් සහ කපා හරින ලද ශේෂයන් අයකරගැනීම් (Written off recoveries) පිළිබඳ විස්තර පහත දැක්වේ.

රු.මිලියන

වර්ෂය	කපා හරින ලද ශේෂයන්			අයකර ගන්නා ලද කපා හැරීම්
	ප්‍රාග්ධනය	පොළිය	එකතුව	
2020	363.20	1,321.12	1,684.32	13.57
2021	108.86	761.26	870.12	15.29
2022	276.67	365.45	642.12	15.35
2023	40.31	26.93	67.24	190.57
2024	-	7.12	7.12	36.01
	789.04	2,481.88	3,270.92	270.79

සටහන: 2024 වර්ෂය තුළ, බැංකුවේ ප්‍රාග්ධන කපා හැරීමේ වටිනාකමට රු. 1 බැගින් වූ ප්‍රාග්ධන හිඟ ශේෂයක් සහිත පහසුකම් 26 ක් සඳහා රු. 26 ක් ඇතුළත් වේ.

ගිණුම් පොත් නිසි ලෙස පිළිබිඹු කිරීමේ අරමුණින් සෑම වසරකම අදාළ වන පරිදි අයකර ගත නොහැකි අක්‍රීය ණය සඳහා කපා හැරීමේ ප්‍රතිපත්තිය බැංකුව විසින් අනුගමනය කරන ලදී. එසේ කපා හරින ලද අත්තිකාරම් අයකර ගැනීම සඳහා ගත හැකි සියලු අයකර ගැනීමේ පියවරයන් අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

තවද, කපා හරින ලද ණය අයකර ගැනීම, අයකිරීම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකයක් ලෙස සකසා ඇති අතර, අයකර ගැනීමේ ක්‍රියාවලියේ ඵලදායීතාවය සහතික කිරීම සඳහා මාසිකව සමීපව අධීක්ෂණය කරනු ලැබේ.

2025 ජුනි 30 දිනට, සමුච්චිත කපා හැරීමේ වටිනාකම රු. 1.00 (තනි පහසුකමක් පමණි) වූ අතර, කපා හැරීමේ අයකර ගැනීම් මාසයේ මේ දක්වා වටිනාකම රු. මිලියන 16 කි. තවද, 2024 වර්ෂය තුළ, බැංකුව විසින් කපා හැර ඇත්තේ ප්‍රාග්ධන හිඟ ශේෂය රු. 1.00 ක් බැගින් වන රු.26 ක ණය පහසුකම් 26 ක්

		පමණක් වන අතර, කපා හැරීම් අයකර ගැනීමේ මුදල රු. මිලියන 36 කි.
1.5.3.5.	2024 දෙසැම්බර් 31 දිනට අදියර 3 කාණ්ඩය යටතේ වර්ගීකරණය කරන ලද ණය පසුගිය වසරට සාපේක්ෂව රු. මිලියන 23,239 කින් හෙවත් සියයට 8 කින් වැඩි වී තිබුණි.	2025 ජුනි 30 දිනට අදියර 3 ණය රු. මිලියන 308,839.6 ක් වූ අතර එය 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 307,001.3 හා සැසඳීමේදී රු.මිලියන 1,838.3 ක (සියයට 0.6) වැඩිවීමක් නිරූපණය කරයි. අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන්, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආංශික ආතතිය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ආනයන මත යැපෙන ව්‍යාපාර මෙන්ම විදේශ මුදල් නිරාවරණයන් කෙරෙහි මුදල් අවප්‍රමාණය වීම මෙම වෙනස සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. සවිස්තරාත්මක සමාලෝචනය අනුව මෙම වැඩිවීම බොහෝ දුරට ණය කළඹෙහි පුළුල් පදනමකින් පිරිහීමක් නොවන අතර විශාල නිරාවරණයන් කිහිපයක් සංකේන්ද්‍රණය වී ඇති බව පෙනී යයි. බැංකුව ණය කළඹ අධීක්ෂණය ශක්තිමත් කර ඇති අතර, ප්‍රායෝගිකව කළහැකි ගිණුම් ප්‍රතිව්‍යුහගත කර ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී අයකර ගැනීමේ සහ නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත. SLFRS 9 යටතේ ප්‍රමාණවත් වෙන්කිරීම් කර ඇති අතර, තවදුරටත් ලිහිල් වීම අවම කිරීම සඳහා වැඩිදියුණු කළ ණය අවදානම් කළමනාකරණ පිළිවෙත් හඳුන්වා දී ඇත.
1.5.3.6.	2024 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 10 ඉක්මවූ මුළු අක්‍රීය අත්තිකාරම් (CIF මට්ටම) වටිනාකම රු. මිලියන 134,569.03 ක් වූ අතර, එහි අයවිය යුතු ප්‍රාග්ධනය රු.මිලියන 63,621.62 ක් සහ අයවිය යුතු පොලී ශේෂය රු.මිලියන 70,947.41 ක් විය. ඉහත සඳහන් මුළු අයවිය යුතු ප්‍රාග්ධන මුදලින් රු.මිලියන 34,761.4 ක් හෙවත් සියයට 54.64 ක්	2025 ජුනි 30 දිනට රු.මිලියන 10 ඉක්මවූ මුළු අක්‍රීය අත්තිකාරම් (CIF මට්ටම) රු.මිලියන 140,934.97 ක් වූ අතර 2024 දෙසැම්බර් 31 දිනට මුළු ශේෂය වූ රු.මිලියන 134,569.03 හා සැසඳීමේදී රු.මිලියන 6,365.94 ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2025 ජුනි 30 දිනට අයවිය යුතු ප්‍රාග්ධනය සහ පොලිය පිළිවෙලින් රු.මිලියන

සඳහා ප්‍රමාණවත් සුරැකුම් නොතිබුණි. විස්තර පහත දැක්වේ.

සුරැකුම් විස්තරය	**2024.12.31 දිනට අයවිය යුතු ප්‍රාග්ධනය රු.මිලියන**	**මුළු අයවිය යුතු ප්‍රාග්ධනයෙන් රු.මිලියන 10ට වැඩි අක්‍රීය ණය %**
ප්‍රමාණවත් නොවූ දේපල සුරැකුම් /වෙනත් සුරැකුම්	15,402.17	24.21
ආයතනික ඇපකර	5,927.98	9.32
පුද්ගල ඇපකර	8,491.23	13.35
සුරැකුම් රහිත	4,940.02	7.77
එකතුව	34,761.40	54.64

1.5.3.7. 2024 දෙසැම්බර් 31 දිනට වටිනාකම වැඩිම අක්‍රීය ණය 10 හි (Top 10 NPLs) මුළු අයවිය යුතු ශේෂය රු.මිලියන 75,240.01 වන අතර එයට ප්‍රාග්ධනය අයවිය යුතු ශේෂය රු.මිලියන 33,949.97 සහ පොළී ශේෂය රු.මිලියන 41,290.04 ඇතුළත් වේ. විස්තර පහත පරිදි වේ.

66,450.08 ක් සහ රු.මිලියන 74,484.89 ක් වේ. (එකතුව රු. මිලියන 140,934.97)

මෙයට ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රුපියලේ අවප්‍රමාණය, ප්‍රතිලේඛණගත කරන ලද අක්‍රීය අත්තිකාරම් අක්‍රීය ණය කළඹට එකතු වීම සහ ගෝලීය අක්‍රීය බලපෑම යනාදිය හේතු විය.

අදාළ පහසුකම්වල මූලික අත්තිකාරම් මුදාහැරීමේ අදියරේදී අත්තිකාරම් සුරැකුම්කරණය ඉතා ප්‍රබල ලෙස සලකනු ලැබේ. කෙසේ වෙතත්, අයකරගැනීම් දෙපාර්තමේන්තුව හරහා අක්‍රීය පහසුකම් ප්‍රතිලේඛණගත කිරීමේදී විශේෂයෙන් අනාරක්ෂිත පහසුකම් සහ අඩු සුරැකුම්පත් සහිත පහසුකම් ශක්තිමත් කිරීමට උපරිම උත්සාහයක් දරමු.

ණය අයකර ගැනීම සඳහා සියලු ක්‍රියාමාර්ග ගෙන තිබියදීත්, ඉහළම අක්‍රීය ණය 10 හි ප්‍රාග්ධන තත්ත්වය ඉහළ ගොස් ඇත. 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන ශේෂය හා සැසඳීමේදී ශේෂය රු.මිලියන 463.81 කින් වැඩි වී ඇති අතර රුපියල අවප්‍රමාණය වීම, ආර්ථිකයේ පවතින තත්ත්වය සහ ණය කළඹේ අත්තිකාරම් වර්ගීකරණ වෙනස්කම් ආදිය හේතුවිය. උදා: ගෝලීය අක්‍රීය ණය

2024 දෙසැම්බර් 31 වන විට අයවිය යුතු ප්‍රාග්ධනය – රු. මිලියන 33,949.97
2025 ජුනි 30 වන විට අයවිය යුතු ප්‍රාග්ධනය – රු. මිලියන 34,413.78

තවද, වැඩි වූ රු.මිලියන 463.81ක ප්‍රාග්ධන ශේෂයට, සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පීඑල්සී හි රු. මිලියන 324.40 ප්‍රතිලේඛණගත කරන ලද ප්‍රාග්ධන අත්තිකාරම් ඇතුළත් වන අතර එහි 2024

දෙසැම්බර් 31 දිනට හා 2025 ජුනි 30 දිනට ප්‍රාග්ධන ශේෂය පිළිවෙලින් රු. මිලියන 2,499.47 ක් හා රු. මිලියන 2,823.87 ක් විය.

	ගනුදෙනුකරුගේ නම	ණය ගණන	ප්‍රාග්ධන ශේෂය රු . මිලියන	පොලී ශේෂය රු . මිලියන	මුළු ශේෂය රු . මිලියන
1	ලංකා හොටෙල්ස් ඇන්ඩ් රෙසිඩන්සීස් (පුද්) සමාගම	**4**	**5,488.94**	**2,727.90**	**8,216.84**
2	W.M. මෙන්ඩිස් සහ සමාගම	**9**	**3,840.38**	**1,243.43**	**5,083.81**
3	ශ්‍රී ඉක්විප්මන්ට් ෆයිනෑන්ස් ලිමිටඩ්	**1**	**3,713.73**	**703.88**	**4,417.61**
4	ද ග්‍රෑන්ඩ් මවුන්ටන් හෝටල් (පුද්) සමාගම	6	1,458.50	1,213.10	2,671.60
	ලක් ස්ටීල් ඉංජිනියරින් (පුද්) සමාගම	7	1,613.05	907.20	2,520.25
	ලක් ජිප්සම් (පුද්) සමාගම	11	150.97	51.45	202.42
	ලක් බ්‍රෑන්ඩ් ෆර්නිචර් (පුද්) සමාගම	6	65.60	0.28	65.88
		30	**3,288.12**	**2,172.03**	**5,460.15**
5	CML MDT කන්ස්ට්‍රක්ෂන් සමාගම	34	2,582.04	3,757.48	6,339.52
	වෝර්කස් පයිලින් (පුද්) සමාගම	19	343.45	437.18	780.62
	වෝර්කර්ස් ඉක්විප්මන්ට් සමාගම	12	293.16	379.84	673.00
	වෝර්කර්ස් සන්ස් ඇන්ඩ් කම්පැණි ඉංජිනියර්ස් (පුද්) සමාගම	1	25.55	119.11	144.67
	MTD වෝර්කර්ස් පොදු සමාගම	1	7.10	7.89	14.99
		67	**3,251.30**		

				4,701.50	**7,952.80**
6	නවලෝක ස්ටීල් ඉන්ඩස්ට්‍රීස් පුද් සමාගම	3	516.73	394.14	910.87
	නවලෝක කන්ස්ට්‍රක්ෂන් (පුද්) සමාගම	31	2,231.14	1,868.07	4,099.21
	ඊස්ට් වෙස්ට් මාර්කටින් (පුද්) සමාගම	1	138.50	71.14	209.64
	නිව් ඇෂ්ෆෝර්ඩ් ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම	2	33.18	19.05	52.23
	නවලෝක පෙට්‍රෝලියම් (පුද්) සමාගම	1	115.00	60.13	175.13
		38	**3,034.55**	**2,412.54**	**5,447.08**
7	යශෝධා හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම	36	2,424.32	19,274.82	21,699.14
	යශෝධා මාර්කටින් සර්විසස් (පුද්) සමාගම	1	0.73	5.70	6.44
	යෝෂි ඇඩ්වටයිසින් (පුද්) සමාගම	1	0.47	3.68	4.16
	යුනි ඒජන්සීස් ට්‍රාන්ස්පෝට්(පුද්) සමාගම	1	0.84	6.62	7.46
	යුනි ප්‍රින්ටර්ස් (පුද්) සමාගම	3	11.02	98.39	109.41
	රුහුණු ඇග්‍රෝ ෆර්ටිලයිසර් (පුද්) සමාගම	9	498.50	4,031.62	4,530.12
	රුහුණු ප්ලයිවුඩ් ප්‍රඩක්ට් (පුද්) සමාගම	2	90.25	626.18	716.43
	මර්නි බේකරි ඉක්විප්මන්ට් (පුද්) සමාගම	1	4.30	28.94	33.24
		54	**3,030.44**	**24,075.94**	**27,106.38**
8	මිහින් ලංකා (පුද්) සමාගම	**3**	**3,017.17**	**867.05**	**3,884.22**
9	හුරාවී ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම	**1**	**2,785.88**	**1,985.82**	**4,771.70**

10	සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පීඑල්සී	3	2,499.47	399.95	2,899.42
		210	33,949.97	41,290.04	75,240.01

1.5.3.8. රජය සතු ව්‍යවසායන්ට (SOEs) නිරාවරණය

(i) 2024 දෙසැම්බර් 31 වන දිනට මධ්‍යම රජයට සහ රාජ්‍ය ව්‍යවසායන්ට අයත් මුළු අයවිය යුතු ණය සහ අත්තිකාරම් වටිනාකම රු.මිලියන 455,957 ක් හෙවත් බැංකුවේ මුළු ණය සහ අත්තිකාරම් කළඹෙන් සියයට 27.28 ක් ලෙස වාර්තා වේ. ඒ අනුව, පෙර වසරට සාපේක්ෂව රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් රු. මිලියන 325,445 ක් හෙවත් සියයට 41.65 කින් අඩු වී තිබුණි. කෙසේ වෙතත්, රාජ්‍ය ව්‍යවසාය ණය ශේෂයෙන් රු. මිලියන 262,583 ක්, රජය විසින් පවරා ගන්නා ලද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ණය සම්බන්ධයෙන් භාණ්ඩාගාර බැඳුම්කර පහක් බවට පරිවර්තනය කර තිබුණි.

2024 දෙසැම්බර් 31 දිනට රජය සතු ව්‍යවසාය සඳහා වූ ණය සහ අත්තිකාරම් රු.මිලියන 455,967 සිට 2025 ජූනි 30 වන විට රු.මිලියන 429,426 (අයවිය යුතු ප්‍රාග්ධනය) දක්වා අඩුවී ඇත.

තවද, 2024 දෙසැම්බර් මාසයේදී CPC දේශීය ප්‍රතිව්‍යුහගත කිරීම අවසන් කරන ලදී. ඒ අනුව, ඇමරිකානු ඩොලර් නිරාවරණය ඇමරිකානු ඩොලර් මිලියන 546.2 ක කාලීන ණයක් බවට පරිවර්තනය කරන ලදී. රු.බිලියන 262.58 ක ශ්‍රී ලංකා රුපියල් නිරාවරණය බැඳුම්කර බවට පරිවර්තනය කරන ලද අතර දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම්වලට අනුව ඇමරිකානු ඩොලර් නිරාවරණය ආපසු ගෙවීම සිදුවේ.

(ii) 2024 දෙසැම්බර් 31 දිනට රජයේ ආයෝජන සහ රජයෙන් ලැබිය යුතු අනෙකුත් දෑ රු.මිලියන 1,505,120 ක් වූ අතර ඒ අනුව, මධ්‍යම රජය සහ රාජ්‍ය ව්‍යවසාය (SOEs) සඳහා වූ මුළු නිරාවරණය රු.මිලියන 1,961,077 ක් සහ එය බැංකුවේ මුළු වත්කම්වලින් සියයට 59.47 ක් නිරූපණය කරයි.

2025 ජූනි 30 දිනට රජයේ ආයෝජන සහ රජයෙන් ලැබිය යුතු අනෙකුත් දෑ රු.මිලියන 1,668,894 ක් වූ අතර ඒ අනුව, මධ්‍යම රජය සහ රාජ්‍ය ව්‍යවසාය (SOEs) සඳහා වූ මුළු නිරාවරණය රු.මිලියන 2,120,165 ක් සහ එය බැංකුවේ මුළු වත්කම්වලින් සියයට 59.36 ක් නිරූපණය කරයි.

(iii) පසුගිය වසර 5 ක කාලය තුළ මධ්‍යම රජය සහ රජය සතු ව්‍යවසායන්හි (SOEs) ණය සහ අත්තිකාරම් වල මුළු අයවිය යුතු ශේෂය සහ රජයේ ආයෝජන සහ රජයෙන් ලැබිය යුතු වෙනත් දෑ පහත දැක්වේ.

මෑත වසරවලදී නිරාවරණ මට්ටම් ඉහළ මට්ටමක පැවතුනද, බැංකුව ප්‍රමාණවත් වෙන්කිරීම් පවත්වා ගෙන යන අතර එවැනි නිරාවරණ සමීපව නිරීක්ෂණය කිරීම දිගටම සිදුවේ. SOE ණය මත යැපීම අඩු කිරීම සඳහා විවිධාංගීකරණ උපාය මාර්ගයක් ආරම්භ කර ඇත.

ණය හා අත්තිකාරම්	**2020**	**2021**	**2022**	**2023**	**2024**
මධ්‍යම රජයට හා රාජ්‍ය ව්‍යවසයන්ට (SOEs) අයත් ණය (රු. මිලියන)	844,821	937,386	871,619	781,402	455,957
පෙර වර්ෂයට සාපේක්ෂව මධ්‍යම රජයට හා රාජ්‍ය ව්‍යවසායන්ගේ ශේෂයේ වැඩිවීම (රු . මිලියන)	243,525	92,564	(65,767)	(90,217)	(325,445)
පෙර වර්ෂයට සාපේක්ෂව මධ්‍යම රජයට හා රාජ්‍ය ව්‍යවසායන්ගේ ශේෂයේ වැඩිවීම %	**40.55**	**10.96**	**(7.02)**	**(10.35)**	**(41.65)**
මුළු ණය හා අත්තිකාරම් (රු . මිලියන)	1,723,466	1,936,974	1,915,788	1,846,389	1,671,180
බැංකුවේ මුළු ණය හා අත්තිකාරම්වලින් මධ්‍යම රජයට හා රාජ්‍ය ව්‍යවසායන්ට අයත් ණය %	**49.02**	**48.39**	**45.50**	**42.32**	**27.28**
බැංකුවේ මුළු වත්කම් (රු. මිලියන)	2,230,119	2,647,641	2,972,028	3,038,195	3,297,799
බැංකුවේ මුළු වත්කම්වලින් මධ්‍යම රජයට හා රාජ්‍ය ව්‍යවසායන්ට	37.88	35.40	29.33	25.72	13.83

අයත් ණය %					
ආයෝජන හා මධ්‍යම රජයෙන් ලැබිය යුතු වෙනත් දෑ (රු . මිලියන)	435,343	672,155	1,024,096	1,041,466	1,505,120
මධ්‍යම රජයට හා රාජ්‍ය ව්‍යවසායන්ට නිරාවරණය වන මුළු වත්කම්	**1,280,164**	**1,609,540**	**1,895,715**	**1,822,868**	**1,961,077**
බැංකුවේ මුළු වත්කම්වලින් මධ්‍යම රජයට හා රාජ්‍ය ව්‍යවසායන්ට නිරාවරණය වන මුළු වත්කම් %	57.40	60.79	63.79	60.00	59.47
රාජ්‍ය ව්‍යවසායන් සඳහා මුළු ගෙවිය යුතු දෑ (ණය ගැනීම් සහ තැන්පතු)	**222,257**	**226,722**	**418,932**	**480,710**	**536,206**

(iv) ජ්‍යෙෂ්ඨ පුරවැසි ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලී ශේෂය

ජ්‍යෙෂ්ඨ පුරවැසි ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලිය ලෙස 2024 වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරයෙන් බැංකුවට රු.මිලියන 11,392.75 ක් ලැබී තිබුණි. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ පුරවැසි ස්ථාවර තැන්පතු සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු පොලී ශේෂය රු.මිලියන 11,202.10 ක් ලෙස සටහන් වී තිබුණි.

2025 ජුනි 30 දිනට අයවිය යුතු ශේෂය රු.මිලියන 9,225 ක් වන අතර එය 2024 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 11,202 ක් විය. 2025 තුළ බැංකුව මහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 1,976 ක් සාර්ථකව අයකර ගන්නා ලදී. නියමිත පරිදි පියවීම සහතික කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය සමඟ අඛණ්ඩ පසු විපරම් සිදු කරනු ලැබේ.

(v) CPC ණය ප්‍රතිව්‍යුහගත කිරීම

අයවැය යෝජනාවට අනුව 2022 දෙසැම්බර් 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහජන බැංකුව විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට(CPC) ලබාදුන් විදේශ මුදල් ණය රජය විසින් පවරා ගන්නා ලදී. ප්‍රතිව්‍යුහගත කිරීමේ නියමයන් සම්බන්ධයෙන් සාකච්ඡා කිහිපයක් පවත්වන ලද අතර 2024 ජුනි 30 දිනට CPC වෙත නිරාවරණය වීම සැලකිල්ලට ගනිමින් 2024 දෙසැම්බර් 13 වන දින ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම අත්සන් කරන ලදී. ඒ අනුව,

2025 ජුනි 30 දිනට, බැංකුවේ CPC වෙත ඇති මුළු නිරාවරණය රු. මිලියන 172,159.44 ක් වන අතර, එයට ඇමරිකානු ඩොලර් ණය පහසුකම් සහ රුපියල් භාණ්ඩාගාර බැඳුම්කර ඇතුළත් වේ. ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය මඟින් වත්කම් කළඹේ ගුණාත්මකභාවය ශක්තිමත් කිරීම, කෙටි කාලීන ආපසු ගෙවීමේ පීඩනය අඩු කිරීම සහ ද්‍රවශීලතා කළමනාකරණය වැඩිදියුණු කර ඇත. අදාළ සියලුම උපකරණ සඳහා රජයේ අනුග්‍රහය ලැබී ඇති බැවින් අයකර ගැනීමේ නිශ්චිතභාවය සහතික කෙරේ.

අ) ඇ.ඩො. මිලියන 446.7 ක අයවිය යුතු ඩොලර් ප්‍රාග්ධනය සහ ඇ.ඩො. මිලියන 99.5 ක උපචිත පොලිය 2044 දෙසැම්බර් 31 දිනට පරිණත වන ඇ.ඩො. මිලියන 546.2 ක නව ණයක් බවට ප්‍රතිව්‍යුහගත කරන ලදී. තවද, ගිවිසුම අනුව ඇ.ඩො. ණය සඳහා අත්තිකාරම් පොලී ගෙවීමක් ලෙස මහා භාණ්ඩාගාරය විසින් රු. මිලියන 31,000 ක අත්තිකාරම් ගෙවීමක් කර තිබුණි.

ඇමරිකානු ඩොලර් මිලියන 446.7 ක අයවිය යුතු ඩොලර් ප්‍රාග්ධනය සහ ඇමරිකානු ඩොලර් මිලියන 99.5 ක උපචිත පොලිය, 2044 දෙසැම්බර් 31 දින කල් පිරෙන නව දිගුකාලීන ඇමරිකානු ඩොලර් ණය පහසුකමක් බවට බැංකුව ප්‍රතිව්‍යුහගත කරන ලදී. ඊට අමතරව, මෙම පහසුකම සඳහා අත්තිකාරම් පොලී ගෙවීමක් ලෙස රු. මිලියන 31,000 ක අත්තිකාරම් පියවීමක් මහා භාණ්ඩාගාරය ලබා දෙන ලදී. මෙම ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් කෙටි කාලීන ආපසු ගෙවීමේ පීඩනය සැලකිය යුතු ලෙස අඩු කිරීම, ආපසු ගෙවීමේ නියමයන් තහවුරු කිරීම, විදේශ මුදල් ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීමට බැංකුවේ හැකියාව වැඩි දියුණු කර ඇත.

ආ) රු.බිලියන 224.4 ක අයවිය යුතු ප්‍රාග්ධන මුදල සහ රු.බිලියන 38.2 ක ගෙවිය යුතු පොලිය, 2026,2028,2030,2032 සහ 2034 වසර වලදී කල් පිරෙන රු.මිලියන 262,583 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර පහක් මඟින් පියවා තිබුණි. තවද, පොලී ආරම්භක දිනයේ සිට කූපන් ආරම්භක දිනය දක්වා නියමිත පොලිය ලෙස රු.මිලියන 1,057 ක අත්තිකාරම් ගෙවීමක් මහා භාණ්ඩාගාරය විසින් ගෙවා තිබුණි.

රු.බිලියන 224.4 ක අයවිය යුතු ප්‍රාග්ධනය සහ රු.බිලියන 38.2 ක උපචිත පොලිය, රු.මිලියන 262,583 ක 2026, 2028, 2030, 2032 සහ 2034 යන වර්ෂවලදී කල්පිරීම් සහිත භාණ්ඩාගාර බැඳුම්කර පහක් නිකුත් කිරීම හරහා පියවන ලදී. ඊට අමතරව, නියමිත පොලිය ලෙස රු.මිලියන 1,057 ක පෙර ගෙවීමක් භාණ්ඩාගාරය විසින්

පියවන ලදී. මෙම සැකැස්ම මඟින් රජයේ ආරක්ෂාව ලත් උපකරණ යටතේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බැංකුවේ නිරාවරණය වීම සුරක්ෂිත කර ඇති අතර, අයකර ගැනීමේ නිශ්චිතභාවය වැඩි දියුණු කර ණය අවදානම අවම කර ඇත.

(vi) ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (SLISBS) ප්‍රතිව්‍යුහගත කිරීම.

2024 නොවැම්බර් 26 වන දින රජය විසින් ගෙවිය යුතු ජාත්‍යන්තර බැඳුම්කර සඳහා නව උපකරණ හුවමාරු කිරීම නිවේදනය කරන ලදී. ඒ අනුව, රජය විසින් දේශීය බැඳුම්කර හිමියන්ට විශේෂයෙන් පිරිනමන ලද SLISB ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනාවේ දේශීය විකල්පයට බැංකුව සහභාගී විය. මෙම විකල්පයේ කොටසක් ලෙස, මුලින් බැංකුව සතුව තිබූ SLISB වල මුහුණත වටිනාකමෙන් සියයට 30 ක් රුපියල් නාමික භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කරන ලදී. මුහුණත වටිනාකමෙන් ඉතිරි සියයට 70, සියයට 10 ක ප්‍රාග්ධන කප්පාදුවක් සහිතව ඇමරිකානු ඩොලර් නාමික step-up බැඳුම්කරයක් හරහා පියවන ලදී. ඊට අමතරව, මුල් SLISB වල උපචිත කූපන් (අතීත නියමිත පොලිය) ඇමරිකානු ඩොලර් නාමික බැඳුම්කරයක් (PDI bond) මඟින් සියයට 11 ක කප්පාදුවකින් පියවන ලදී. ISB වල ආයෝජන කළඹෙහි බැංකුව සතු හිමිකාරිත්වය ඇමරිකානු ඩොලර් මිලියන 51.8 ක් වූ අතර, එයට මුහුණත වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 49.9 ක් සහ අයවිය යුතු මුළු පොලී මුදල ඇමරිකානු ඩොලර් මිලියන 1.9 ක ඇතුළත් වේ. ඒ අනුව, ප්‍රතිව්‍යුහගත කිරීම හේතුවෙන් රු.මිලියන 111.7 ක ප්‍රාග්ධන ලාභයක් සහ රු. මිලියන 3,547.4 ක එක් දින අලාභයක් බැංකුවට සිදුවී තිබුණි.

2024 නොවැම්බර් මාසයේ අවසන් වූ ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසුව, 2025 ජූනි 30 දිනට බැංකුවේ ISB හි හිමිකාරීත්වය ඇ.ඩො. මිලියන 35.5 ක් (රු.මිලියන 10,655.8 ට සමාන) විය. මෙම පරිවර්තනයේ ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 3,547.4 ක එක් වරක් පමණක් වන එක් දින ගිණුම්කරන අලාභයක් සහ ඊට හිලව් ලෙස ප්‍රාග්ධන ලාභ රු.මිලියන 111.7 ක් ලැබී ඇත. භාණ්ඩාගාර බැඳුම්කර සහ ඇ. ඩො. step-up බැඳුම්කර වලින් සමන්විත ප්‍රතිව්‍යුහගත කළඹ, දිගුකාලීන අයකිරීම් අපේක්ෂාවන් සහ කළඹ ස්ථාවරත්වය වැඩි දියුණු කෙරේ.

(vii) රජය සතු ඉහලම ණය සහ අත්තිකාරම් සහිත ව්‍යාපාර 10

2024 දෙසැම්බර් 31 දිනට මධ්‍යම රජය ඇතුළු රජය සතු ව්‍යාපාරවල ඉහළම ණය 10 හි අයවිය යුතු ශේෂයන් රු.මිලියන 429,377 ක් ලෙස සටහන් වී ඇති අතර එහි

2025 අගෝස්තු 31 වන විට රජය සතු ව්‍යාපාරවල ඉහළම ණය 10 හි නිරාවරණය රු. මිලියන 361,412 දක්වා අඩු වී ඇත. තවද, රජය සතු ව්‍යාපාර සඳහා මුදල් ආන්තික

ප්‍රාග්ධනය රු.මිලියන 421,034 ක් සහ පොලිය රු. මිලියන 8,343 කි. මෙය මධ්‍යම රජයට සහ රජය සතු ව්‍යාපාරවලට අයත් ණය සහ අත්තිකාරම්වල මුළු අයවිය යුතු ශේෂයෙන් සියයට 94.2 ක් නියෝජනය කරයි. විස්තර පහත දැක්වේ.

පහසුකම් හැර නව පහසුකම් ලබා දී නොමැති අතර පවතින පහසුකම් අභ්‍යන්තර සීමාවන් තුළ ගෙවමින් පවතී.

නම	මුළු අයවිය යුතු මුදල (රු. මිලියන)	සුරැකුම් වර්ගය	සුරැකුම් වටිනාකම (මිලියන)
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්	4,859.06	ණය ගිවිසුම	-
	168,916.82	භාණ්ඩාගාර හානි පූර්ණය	-
එකතුව	**173,775.88**		
ලංකා විදුලි බල මණ්ඩලය	400.57	සුරැකුම් රහිත	-
	47,872.49	ලැබිය යුතු දෑ මත උකස්කරය (රු.)	38,887.50
	12,650.51	භාණ්ඩාගාර ඇපකරය (රු.)	12,543.67
එකතුව	**60,923.57**		
මාර්ග සංවර්ධන අධිකාරිය	248.19	ගාස්තු එකතු කිරීම පිළිබඳ පැවරුම	-
	13,652.09	භාර ගැනීමේ ලිපිය (රු.)	12,892.88
	33,872.82	භාණ්ඩාගාර ඇපකරය (රු.)	35,000.00
	3,524.36	භාණ්ඩාගාර ඇපකරය (ඇ.ඩො)	44.72
	8,965.17	භාණ්ඩාගාර හානි පූර්ණය (රු.)	8,380.06
එකතුව	**60,262.63**		
ශ්‍රී ලංකන් ගුවන් සේවය	1,426.30	භාණ්ඩාගාර ඇපකරය (රු.)	1,351.90
	5,732.05	භාණ්ඩාගාර ඇපකරය (ඇ.ඩො)	42,882.57
	14,081.05	භාණ්ඩාගාර සහන ලිපිය (රු.)	13,450.00
	30,139.38	භාණ්ඩාගාර සහන ලිපිය (ඇ.ඩො)	100.00
එකතුව	**51,378.78**		
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ	18,024.54		-

එකතුව	**18,024.54**		**-**
රාජ්‍ය පොහොර සමාගම	73.87	නැවත මුදල් (Cash Back) (රු.)	1,660.00
	17,918.85	භාණ්ඩාගාර සහන ලිපිය (රු.)	38,503.30
එකතුව	**17,992.72**		
ශ්‍රී ලංකා නැව් සංස්ථාව	15,494.83	භාණ්ඩාගාර ඇපකරය (ඇ.ඩො)	143.82
එකතුව	**15,494.83**		
ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය	1,585.51	පහසුකමේ සම්පූර්ණ කාලසීමාව සඳහා ණය වටිනාකමෙන් සියයට 25 ක් ආවරණය වන රජයේ භාණ්ඩාගාර ඇපකරය සහ අයවැය ප්‍රතිපාදන වලින් ණය බැඳීම්වලින් සියයට 75 ක් පියවා ගැනීමට මුදල් අමාත්‍යාංශයේ පොරොන්දුව	
	2,317.61	භාණ්ඩාගාර ඇපකරය (රු.)	3,874.69
	1,031.48	භාණ්ඩාගාර ඇපකරය (යූරෝ)	7,624.77
	7,945.88	භාණ්ඩාගාරය භාර ගැනීමේ ලිපි (රු.)	9,613.00
එකතුව	**12,880.48**		
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	2,942.59	සහන ලිපිය (රු.)	6,000.00
	9,860.27	සුරැකුම් රහිත	
එකතුව	**12,802.86**		
නාගරික සංවර්ධන අධිකාරිය	5,840.65	භාණ්ඩාගාරය භාර ගැනීමේ ලිපිය (රු.)	11,510.00
එකතුව	**5,840.65**		
මුළු එකතුව	**429,376.94**		

1.5.3.9. සිලෝන් රෝයල් ටීස් (පුද්) සමාගම වෙත ලබාදුන් ණය පිළිබඳ නිරීක්ෂණ

ඉහත සමාගම ඇමරිකා එක්සත් ජනපදය, චිලී, කැනඩාව සහ චීනය වෙත අගය එකතු

බැංකුවේ ස්ථාපිත චක්‍රලේඛ සහ මාර්ගෝපදේශයන් ට අනුකූලව

කළ තේ අපනයනය කිරීමේ නිරත වන අතර සමාගමේ අධ්‍යක්ෂවරයෙකු විදේශ සේවයේ නියෝජිතයෙකු විය. ඉහත සමාගම සම්බන්ධයෙන් 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 194.1 ක ප්‍රාග්ධන ලැබිය යුතු ශේෂයක් වාර්තා වී තිබුණි. පහත නිරීක්ෂණ සිදු කෙරේ.		සුදුසුකම් ලත් ණය ගැණුම්කරුවන්ට ණය සහ අත්තිකාරම් ලබා දීමට අවශ්‍ය පියවර ගන්න. තවද, ආන්තික ගිණුමේ ඇති අරමුදල් සඳහා පොලී ගෙවීම සම්බන්ධයෙන් ස්ථාපිත ක්‍රියා පටිපාටියක් නොමැති බැවින් ප්‍රතිපත්ති සකස් කර අනුමත කරගත යුතුය.
I. ණය ක්‍රියා පටිපාටි අත්පොතෙහි 8 වන ශීර්ෂයේ 8.3 වගන්තිය අනුව, ණය මූලධර්මයක් ලෙස ණය ගැනුම්කරුගේ චරිතයෙහි අවංකභාවය තක්සේරු කළ යුතුය. තවද, 2023 ඔක්තෝබර් 09 දිනැති අභ්‍යන්තර සංදේශයට අනුව, මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් ඉහත අධ්‍යක්ෂවරයාට අදාළව එක්සත් ජනපද රජය විසින් කොලොම්බියාවේ දිස්ත්‍රික් අධිකරණයේ සහ ශ්‍රී ලංකා රජය විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ තවත් නඩුවක් ගොනු කර තිබුණි. මුදල් විශුද්ධිකරණය පිළිබඳ නඩුව සැමවිටම ගැටලුසහගත වන අතර විශුද්ධිකරණය කළ මුදල් රජයට අත්පත් කර ගත හැකිය. කෙසේ වෙතත්, අධිකරණ ක්‍රියාමාර්ගවල සහතික කළ පිටපත් හෝ ඉහත නඩුවෙන් ඉවත් කර ගැනීම හෝ නිදහස් කිරීමකින් තොරව බැංකුව ණය පහසුකම් අනුමත කර තිබුණි. තවද, 2024 ජූලි 24 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුවේ (BECC) සටහන අනුව, නඩු සම්බන්ධයෙන් අධිකරණය විසින් නිකුත් කරන ලද ක්‍රියාමාර්ග හෝ නියෝග හැර තෙවන පාර්ශවයන් විසින් ලබා දෙන ප්‍රකාශ විශ්වාස කළ නොහැකි බව නීති දෙපාර්තමේන්තුව දන්වා ඇත.	නීතිමය මතය, අපනයන ප්‍රේෂණ, යෝජිත වටිනා නිශ්චල සුරැකුම් සහ සතුටුදායක අතීත ආපසු ගෙවීම කෙරෙහි අවධානය යොමු කර, අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 321/2024 මඟින් අධිකරණ ක්‍රියාමාර්ගවල සහතික කළ පිටපත් හෝ එවැනි නඩුවක ඉල්ලා අස්කර ගත් හෝ නිදහස් කරන ලද හෝ අවසාන ඇතුළත් කිරීම ලබා ගන්නා ලෙස පනවා තිබූ කොන්දේසිය ඉවත් කර පහසුකම් ලබා දීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 613/2024 මඟින් මණ්ඩලයේ අනුමැතිය ලබාගන්නා ලදී.	
II. ශ්‍රී ලංකා රුපියල් ආන්තික ගිණුමේ ඇති අරමුදල් සඳහා සිලෝන් රෝයල් ටීස් (පුද්ගලික) සමාගමට අදාළව 2024 ජූලි 23 වන දින රු.මිලියන 10 ක ස්ථාවර තැන්පතුවක් විවෘත කර තිබුණි. කෙසේ වෙතත්, ආන්තික ගිණුම්වල ඇති අරමුදල් සඳහා ස්ථාවර තැන්පතු විවෘත කිරීම සම්බන්ධයෙන්	ඔවුන්ගේ ඉල්ලීම පරිදි සමාගමේ නමින් විවෘත කරන ලද ශ්‍රී ලංකා රුපියල් ඉතුරුම් ආන්තික ගිණුමේ ඇති අරමුදල් හර කිරීමෙන් ස්ථාවර තැන්පතුව විවෘත කරන ලද අතර සමාගමේ නමින් ලබා දී ඇති කාලීන ණය සඳහා නැවත අනුයුක්ත කරන ලදී.	

බැංකුවේ කිසිදු ස්ථාපිත ක්‍රියා පටිපාටියක් නොමැත.

1.5.3.10. දේශපාලනිකව නිරාවරණය වූ පුද්ගලයන්ට ලබාදුන් ණය සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ (PEPs)

SMELoC අතිරේක මූල්‍යකරණ III - කුඩා තේ වතු හිමියන්ගේ යෝජනා ක්‍රමය යටතේ කෑගල්ල ප්‍රධාන ශාඛාව විසින් 2023 ඔක්තෝබර් 31 දින නව තේ වගාවක් සඳහා 0278001000010642 සහ 0278001000010651 යන ණය අංක යටතේ සියයට 16.36 ක පොලී අනුපාතයකට රු. මිලියන 5 ක (රු. මිලියන 4.5 සහ රු. මිලියන 0.5) ණය ලබා දී ඇත. ඉහත ණය මුදල අක්කර 30 ක්, රූඩ් 02 ක් සහ පර්චස් 18 ක භූමි ප්‍රමාණයකින් යුත් රු. මිලියන 48 ක බලපෑම් සහගත විකිණීමේ වටිනාකමක් ඇති "මඩොල්තැන්න වතුයාය" නම් දේපල උකස් කිරීමෙන් සුරක්ෂිත කර ඇත. යොමු අංක SMELoC/2023/PB/AF3/TEAG/T5/0013058 යටතේ මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රතිමූල්‍ය අනුමත කර ඇත. ඒ අනුව, රු. 500,000 ක JFPR ප්‍රදානය අනුමත කර ඇති අතර 2024 පෙබරවාරි 05 වන දින සිට සියයට 10 ක පොලී අනුපාතයක් ක්‍රියාත්මක කර ඇත. පහත නිරීක්ෂණ සිදු කෙරේ.

ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම යටතේ ලබා දෙන ණය වලට අදාළ අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම සහ වගකිවයුතු පාර්ශ්වයන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.

I. කළමනාකරන චක්‍රලේඛ අංක 810/2021 අනුව, අක්කර 10 නොඉක්මවන ඉඩම් හිමිකාරිත්වයක් ඇති කුඩා තේ වතු හිමියන්ට දරිද්‍රතාවය අඩු කිරීමේ ජපන් අරමුදල (JFPR) ප්‍රදානය සඳහා අවසර ලබයි. කෙසේ වෙතත්, ඉහත ණය මුදල සඳහා ණය ගැනුම්කරු සතු අක්කර 30 ක උකස් දේපලක්(ණය ලේඛනවලට අනුව) මඟින් සුරක්ෂිත කර තිබුණි. ඒ අනුව, රු. 500,000 ක ඉහත ප්‍රදානය සඳහා සුදුසුකම් නොලබයි.

අදහස සටහන් කර ගන්නා ලදී. අදහස් දැක්වීම් වලට අනුව, සැලකිය යුතු විතැන්වීම් නිරීක්ෂණය විය. ඒ අනුව, මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වන ලෙස නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, සංවර්ධන සහ ක්ෂුද්‍ර මූල්‍ය) උපදෙස් දී ඇත. කෑගල්ල ප්‍රාදේශීය කළමනාකරු විසින් පරීක්ෂණය ආරම්භ කර ඇති බවත් 2025 සැප්තැම්බර් 30 වන දින වන විට අවසන් වාර්තාව විමර්ශන සහ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට

II. ඉහත ණය මුදල ලබාගෙන ඇත්තේ අක්කර 30 රූඩ් 02 සහ පර්චස් 18 ප්‍රමාණයෙන් යුතු බලපෑම් සහගත

විකුණුම් වටිනාකම රු. මිලියන 48 ක් වන "මඩොල්තැන්න වත්ත" නම් දේපළ උකස් කිරීමෙනි. 2014 නොවැම්බර් 07 දිනැති හුවමාරු ඔප්පු අංක 6432 හි පිටපතට අනුව, ඉඩම් ප්‍රතිසංස්කරණ නීතියේ 22(1)(1) වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ඉහත දේපළ හුවමාරු කර ගෙන ඇත.

(i.) අක්කර 30 රූඩ් 02 පර්චස් 38 ක භූමි ප්‍රමාණයකින් යුක්ත "අමිතිරිගලවත්ත" නම් දේපළ, ණය ගැණුම්කරු විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් මඩොල්තැන්න වත්ත හුවමාරු කර ගැනීම සඳහා පවරා දී ඇත. 1975 මාර්තු 04 දිනැති ගැසට් නිවේදනයට අනුව, ඉහත ණය ගැණුම්කරුට දේපළෙහි බදු අයිතිය සඳහා පමණක් හිමිකම් ඇති අතර එම නිසා, හුවමාරු කරන ලද ඉඩමේ නිදහස් අයිතිය පිළිබඳ ගැටළු සහගතය. කෙසේ වෙතත්, 2023 මාර්තු 02 දිනැති සුරැකුම් තහවුරු කිරීමේ වාර්තාවට අනුව, ඉහත ණය ගැණුම්කරුගේ නිදහස් අයිතිය ශාඛා කළමනාකරු විසින් තහවුරු කර තිබුණි.

(ii.) 2014 නොවැම්බර් 07 දිනැති අංක 6432 දරන හුවමාරු ඔප්පුවේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මුද්‍රාව තබා නොමැති අතර, එය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට (අවශ්‍ය වුවහොත්) බලපෑ හැක.

(iii.) හුවමාරු ඔප්පු අංක 6432 ට අනුව, මඩොල්තැන්න වතුයාය යනු 1996 ජුනි 27 දිනැති බලපත්‍රලාභී මිනින්දෝරුවරයෙකු විසින් සාදන ලද 093/2012 දරණ සැලැස්මෙහි ලොට් අංක 2 ලෙස සලකුණු කර ඇති ඉඩම ගැන සඳහන් කරයි. කෙසේ වෙතත්, එවැනි සැලැස්මක් ණය ගොනුවේ නොතිබුණි. වෙනත් බලපත්‍රලාභී මිනින්දෝරුවරයෙකුගේ ලබා ගත් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන බවත් තහවුරු කර ඇත.

අංක 4633 දරණ සැලැස්ම භුවමාරු ඔප්පුවේ සඳහන් සැලැස්මට වඩා වෙනස් බැවින් නීතිමය ගැටළු ඇති විය හැකිය.

(iv.) ණය ලියකියවිලි වලට අනුව, ඉහත උකස් කරන ලද දේපලෙහි අවුරුදු 30 ක් පැරණි රබර් වගාවක් සහ නව කුරුඳු වගාවක් ඇත. කෙසේ වෙතත්, ගණුදෙනුකරු තේ වගාව සඳහා රු. මිලියන 5 ක ණය මුදල ඉල්ලා තිබුණි.

අ) 2024 ජූලි 07 දිනැති පරීක්ෂණ වාර්තාව අනුව, නිශ්චිත අරමුණ සඳහා රු. මිලියන 3 භාවිතා කළ බව ශාඛා කළමනාකරු විසින් තහවුරු කර තිබුණි. කෙසේ වෙතත්, 2025 අප්‍රේල් 25 දිනැති විගණන පරීක්ෂාවේදී, ඉහත ඉඩමේ තේ වගාවක් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.

ආ) තවද, එම ප්‍රදේශයේ තේ වතු නොමැති බවත් රබර් වතු පමණක් ඇති බවත් පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තේ දළු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් නිරීක්ෂණය නොවූ අතර එම නිසා තේ වගාව කිරීම අපහසුය. කෙසේ වෙතත්, ණය ලබා දීමට පෙර ශාඛාව අදාළ කරුණු පිළිබඳව සලකා බලා නොතිබුණි.

1.5.3.11. **සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස්හි සභාපති වෙත ලබාදුන් ණය පිළිබඳ නිරීක්ෂණ**

I. <u>ණය අංක: 48001000008803- රු.මිලියන 500</u>

සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පීඑල්සී හි හිමිකම් නිකුතුවට දායක වීම සඳහා සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පීඑල්සී හි කොටස්වල සුරැකුම් මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව (BECC) විසින් BECC අංක 222/2018 දරන පත්‍රිකාවේ ගත් තීරණයට අනුව, රු.මිලියන

බැංකුවේ ස්ථාපිත චක්‍රලේඛ සහ මාර්ගෝපදේශවලට අනුකූලව ණය සහ අත්තිකාරම් ලබා දීමට අවශ්‍ය පියවර ගන්න.

500 ක කාලීන ණය පහසුකමක් 2018 මාර්තු 27 වන දින ඉහත ගනුදෙනුකරුට ලබා දී තිබුණි. ඉහත ණය මුදල වසර 01 ක සහන කාලයක් ඇතුළුව වාර්ෂික වාරික 6 කින් වසර 07 ක් ඇතුළත ආපසු ගෙවිය යුතුය. පහත නිරීක්ෂණ සිදුකෙරේ.

(i.) ණය ක්‍රියා පටිපාටි අත්පොතෙහි (CPM) ශීර්ෂය-15 කොටස් වෙළඳපොළ ගනුදෙනු සඳහා ණය නිරාවරණය 6.3 වගන්තියට අනුව, ගනුදෙනුකරුවෙකුට පිරිනමනු ලබන පහසුකමේ වටිනාකම, සුරැකුමක් ලෙස පිරිනමනු ලබන කොටස් සංචිතයේ මුළු බලපෑම් සහගත විකුණුම් වටිනාකම (FSV) ඕනෑම අවස්ථාවක නොඉක්මවිය යුතුය. CPM හි ශීර්ෂය 15- 3.3.2 වගන්තිය තක්සේරුව අනුව, වත්මන් වෙළඳපල වටිනාකමෙන් සියයට 50 ක් ලෙස FSV ගණනය කෙරේ. ඒ අනුව, සුරැකුමේ FSV රු. මිලියන 384 ක් (කොටස් මිලියන 32 * 24 * 50%) ලෙස ගණනය කරන ලද අතර ඒ අනුව, බැංකුව විසින් ප්‍රමාණවත් සුරැකුම් ලබාගෙන නොමැත.

එම සලකා බලන ලද අවස්ථාවේදී ණය ගැණුම්කරු හොඳ කාර්ය වාර්තාවක් (පැහැදිලි CRIB වාර්තා) සහිත ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙකු වූ අතර, අවශ්‍ය අනුමැතීන් සහිතව ණය පහසුකම් ලබා දී ඇත. ආපසු ගෙවීම් සමඟ ප්‍රතිලේඛණගත කිරීමෙන් පසු, 2025 සැප්තැම්බර් 16 වන දිනට ගනුදෙනුකරුගේ මුළු නිරාවරණය (අයවිය යුතු ප්‍රාග්ධනය) රු. මිලියන 293.34 කි. 2025 සැප්තැම්බර් 16 දිනට, කොටස් ආවරණය වෙළඳපල වටිනාකමෙන් සියයට 136 ක් (ප්‍රාග්ධනය + හිඟ පොලිය එකතුවෙන්) වේ.

(ii.) CPM- ශීර්ෂය 15 හි කොටස් වෙළඳපොළ ගනුදෙනු සඳහා ණය නිරාවරණයේ 6.4 වගන්තිය අනුව, සුරැකුම් ලෙස පිරිනමන කොටස් සංචිතය සාධාරණ ලෙස විවිධාංගීකරණය කළ යුතු අතර සංචිතය අවම වශයෙන් වෙනස් වර්ගයේ කොටස් තුනක්වත් තිබිය යුතු අතර කිසිදු වර්ගයක කොටසක් සංචිතයේ වෙළඳපල වටිනාකමෙන් සියයට 50 කට වඩා වැඩි නොවිය යුතුය. කෙසේ වෙතත්, ඉහත සඳහන් කරුණු වලට පටහැනිව, සුරැකුම් ලෙස සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පීඑල්සී හි කොටස් පමණක් ලබාගෙන තිබුණි.

එම සලකා බලන ලද අවස්ථාවේදී ණය ගැණුම්කරු හොඳ කාර්ය වාර්තාවක් (පැහැදිලි CRIB වාර්තා) සහිත ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙකු වූ අතර, අවශ්‍ය අනුමැතීන් සහිතව ණය පහසුකම් ලබා දී ඇත.

දැනට ප්‍රතිලේඛණගත කර ඇති කාලීන ණය, ද ලංකා හොස්පිටල් පීඑල්සී, සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පීඑල්සී, සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී, ආසිරි හොස්පිටල් හෝල්ඩින්ග්ස් පීඑල්සී, ඔඩෙල් පීඑල්සී සහ සහ සොෆ්ට්ලොජික් කැපිටල් පීඑල්සී යන සමාගම්වල කොටස් මඟින් සුරක්ෂිත කර ඇත.

අදහස සටහන් කර ගන්නා ලදී.

(iii.) CPM - ශීර්ෂය 15 කොටස් වෙළඳපොළ ගනුදෙනු සඳහා ණය

ණය ගැණුම්කරු ඒ වන විට රටේ කීර්තිමත් ව්‍යාපාරිකයෙකු වීම සහ

නිරාවරණය හි 6.6 වගන්තිය අනුව, ඕනෑම පුද්ගලයෙකුට ආන්තික වෙළඳ පහසුකම් රු.මිලියන 100 නොඉක්මවිය යුතුය. කෙසේ වෙතත්, ඉහත සඳහන් කරුණු වලට පටහැනිව, ඉහත ගනුදෙනුකරුට රු. මිලියන 500 ක් ලබා දී ඇත.

සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පීඑල්සී හි කොටස් පැවරීම යනාදී සීමා පත්‍රිකාවේ දක්වා ඇති සාධාරණීකරණයන් මත පදනම්ව අවශ්‍ය අනුමැතිය ලැබී ඇත. 2025 සැප්තැම්බර් 14 වන විට ගනුදෙනුකරුගේ මුළු නිරාවරණය රු.මිලියන 800.0 සිට රු. මිලියන 293.34 දක්වා අඩු වී ඇත.

(iv.) CPM හි ශීර්ෂය 5 - සාමාන්‍ය ණය දීමේ ක්‍රියාපටිපාටිය/පරිචයන් හි 6.2.8 වගන්තිය අනුව, මිල තීරණය වන පොදු සමාගම් කොටස් වලට එරෙහිව ලබා දිය හැකි ණයවල උපරිම ආපසු ගෙවීමේ කාලය වසරකි. තවද, අවදානම් සටහන් අනුව, සහන කාලයක් නොමැතිව වසර 5 ක කාලයක් සඳහා රු. මිලියන 300 ක් පමණක් යෝජනා කර ඇත. කෙසේ වෙතත්, BECC හි තීරණයට අනුව වසර 01 ක සහන කාලයක් ඇතුළුව වසර 07 කින් ආපසු ගෙවිය හැකි පරිදි රු.මිලියන 500 ක කාලීන ණය පහසුකම අනුමත කර තිබුණි.

ගනුදෙනුකරු විසින් ඒ අවස්ථාවේ ඉදිරිපත් කරන ලද ලියවිලි මඟින් තක්සේරු කරන ලද ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ ධාරිතාව මත පදනම්ව, වසරක සහන කාලයක් ඇතුළුව වසර 7 ක ආපසු ගෙවීමේ කාලයක් සහිතව ණය සැලසුම් කරන ලදී.

II. <u>ණය අංක: 48001000009544 - රු.මිලියන 300</u>

ඉහත ගනුදෙනුකරුට පුද්ගලික ගෙවීම් සිදු කිරීම සඳහා වසර 01 ක සහන කාලයක් ඇතුළුව වසර 5 කින් ආපසු ගෙවිය හැකි පරිදි සමාගම් 7 ක කොටස්වල සුරැකුම් මත පදනම්ව රු. මිලියන 300 ක කාලීන ණය පහසුකමක් 2019 ජූලි 31 වන දින BECC අංක 465/2019 දරන පත්‍රිකාවේ තීරණය අනුව ලබා දී තිබුණි.

(i.) CPM හි ශීර්ෂය 15- කොටස් වෙළඳපොළ ගනුදෙනු සඳහා ණය නිරාවරණය හි 6.3 වගන්තිය අනුව, ගනුදෙනුකරුවෙකුට පිරිනමනු ලබන පහසුකමේ වටිනාකම සුරැකුමක් ලෙස පිරිනමනු ලබන කොටස් සංචිතයේ මුළු බලපෑම් සහගත විකුණුම් වටිනාකම (FSV) ඕනෑම අවස්ථාවක නොඉක්මවිය යුතුය.

එම සලකා බලන ලද අවස්ථාවේදී ණය ගැණුම්කරු හොඳ කාර්ය වාර්තාවක් (පැහැදිලි CRIB වාර්තා) සහිත ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙකු වූ අතර, අවශ්‍ය අනුමැතීන් සහිතව ණය පහසුකම් ලබා දී ඇත. ආපසු ගෙවීම් සමඟ ප්‍රතිලේඛණගත කිරීමෙන් පසු, 2025 සැප්තැම්බර් 16 වන දිනට ගනුදෙනුකරුගේ මුළු නිරාවරණය (අයවිය යුතු

	CPM හි ශීර්ෂය 15 හි 3.3.2 වගන්තිය-තක්සේරුව අනුව, වත්මන් වෙළඳපොළ වටිනාකමෙන් සියයට 50 ක් ලෙස FSV ගණනය කරනු ලැබේ. ඒ අනුව, සුරැකුමේ FSV රු.මිලියන 210 ක් (රු.මිලියන 420 *50%) වූ අතර ඒ අනුව, බැංකුව විසින් ප්‍රමාණවත් සුරැකුම් ලබාගෙන නොතිබුණි.	ප්‍රාග්ධනය) රු. මිලියන 293.34 කි. 2025 සැප්තැම්බර් 16 දිනට, කොටස් ආවරණය වෙළඳපල වටිනාකමෙන් සියයට 136 ක් (ප්‍රාග්ධනය + හිඟ පොලිය එකතුවෙන්) වේ.
(ii.)	CPM හි ශීර්ෂය 5 - සාමාන්‍ය ණය දීමේ ක්‍රියාපටිපාටිය/පරිචයන් හි 6.2.8 වගන්තිය අනුව, මිල තීරණය වන පොදු සමාගම් කොටස් වලට එරෙහිව ලබා දිය හැකි ණයවල උපරිම ආපසු ගෙවීමේ කාලය වසරකි. කෙසේ වෙතත්, BECC හි තීරණයට අනුව වසර 01 ක සහන කාලයක් ඇතුළුව වසර 05 කින් ආපසු ගෙවිය හැකි පරිදි රු.මිලියන 300 ක කාලීන ණය පහසුකමක් අනුමත කර තිබුණි.	ගනුදෙනුකරු විසින් ඒ අවස්ථාවේ ඉදිරිපත් කරන ලද ලියවිලි මඟින් තක්සේරු කරන ලද ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ ධාරිතාව මත පදනම්ව, වසරක සහන කාලයක් ඇතුළුව වසර 5 ක ආපසු ගෙවීමේ කාලයක් සහිතව ණය සැලසුම් කරන ලදී.
(iii.)	2019 ජුනි 28 දිනැති BECC අංක 465/2019 පත්‍රිකාවේ 02 වන සටහනට අනුව, 2019 මාර්තු 31 දිනට ණය ගැනුම්කරුට අනුමත රු. මිලියන 4,625 සීමාවෙන් රු.මිලියන 4,418 ක් අනෙකුත් බැංකු සමඟ ගෙවිය යුතු ශේෂ තිබුණි. කෙසේ වෙතත්, බැංකුව ඉහත ගනුදෙනුකරුට පුද්ගලික අවශ්‍යතා සඳහා ඉහත පහසුකම ලබා දී තිබුණි.	ගනුදෙනුකරුගේ කීර්ති නාමය සහ ඒ කාලයේ තිබූ යහපත් වාර්තාව (පැහැදිලි CRIB වාර්තා තිබීම) මත පදනම්ව, අවශ්‍ය අනුමැතිය සහිතව ණය ලබා දීම සලකා බලන ලදී.
(iv.)	2024 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 382.1 ක මුළු අයවිය යුතු ශේෂයක් වාර්තා කර ඇති අතර ප්‍රාග්ධනය සහ පොලිය ඇතුළු අනෙකුත් ගාස්තු පිළිවෙලින් රු.මිලියන 374.5 ක් සහ රු.මිලියන 7.6 ක් විය.	2024 අගෝස්තු 09 වන දින ප්‍රතිලේඛණගත කිරීම ක්‍රියාත්මක කිරීමත් සමඟ, 2025 සැප්තැම්බර් 14 දිනට ගෙවිය යුතු මුළු මුදල රු. මිලියන 300.46 දක්වා අඩු වී ඇත. (ප්‍රාග්ධනය රු.මිලියන 293.34 සහ පොලිය රු. මිලියන 7.12).

1.5.3.12. **බයෝ ෆුඩ්ස් (පුද්ගලික) සමාගම වෙත ලබාදුන් ණය සම්බන්ධ නිරීක්ෂණ**

හරිත තේ, කුළුබඩු, කළු තේ, පොල් ආශ්‍රිත නිෂ්පාදන, ශීත කළ ඖෂධ පැළෑටි සහ පලතුරු වැනි කාබනික නිෂ්පාදන සැකසීම සහ අපනයනය කිරීම සඳහා සහතික කළ කාබනික සහ සාධාරණ වෙළඳ සමාගමක් ලෙස බයෝ ෆුඩ්ස් (පුද්ගලික) සමාගම 1993 දී පිහිටුවන ලදී. 2020 මැයි 18 දිනැති BECC අංක 394/2020 ප්‍රකාරව, රු. මිලියන 800 ක පවතින ණය පහසුකම් අලුත් කිරීමට සහ වසරක් තුළ එකවර ආපසු ගෙවිය යුතු රු.මිලියන 100 ක කෙටි කාලීන ණය ලබා දීමට BECC හි අනුමැතිය ලබා දී ඇත. පහත නිරීක්ෂණ කෙරේ.		ණය අනුමත කිරීමේ ක්‍රියාවලියේදී ගනුදෙනුකරු නිසි විමර්ශනය සහ ණය විශ්වාසනීයත්වය තක්සේරු කිරීම් වැඩි දියුණු කිරීම මගින් බැංකුවේ ස්ථාපිත චක්‍රලේඛ සහ මාර්ගෝපදේශවලට අනුකූලව සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම සහ අනාගත පැහැර හැරීම් අවම කිරීම සඳහා දැඩි අධීක්ෂණ සහ පසු විපරම් යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. බැංකුවේ අයකර ගැනීමේ උත්සාහයන් කඩිනම් කිරීම සඳහා තවදුරටත් නිර්දේශ කෙරේ.
I. BECC පත්‍රිකා අංක 394/2020 හි සඳහන් විස්තර වලට අනුව, ඉහත සමාගම 2017 මාර්තු 31 සිට අඛණ්ඩ පාඩු පෙන්නුම් කර ඇත. උකස් කරන ලද දේපලෙහි සියයට 100 ක් FSV දක්වා පහසුකම I ලබා දී තිබුණි. බැංකුව විසින් ගනුදෙනුකරු විසින් සපයන ලද තොග වාර්තාව මත පදනම්ව බැංකුවේ තක්සේරුව සහ පරීක්ෂා කිරීමකින් තොරව උකස ලබාගෙන තිබුණි. ණය ගැණුම්කරුගේ අහිතකර තත්ත්වය සහ ප්‍රමාණවත් නොවූ සුරකුම් සැලකිල්ලට නොගෙන, ණය ගැණුම්කරුගේ ව්‍යාපාරික කටයුතු මූල්‍යකරණය කිරීම සඳහා පුද්ගල ඇප මත පදනම්ව බැංකුව රු.මිලියන 100 ක ණයක් ලබා දී තිබුණි.	මෙම ණය පැකේජය 2003 දී මුලින්ම ප්‍රදානය කරන ලද අතර ඔවුන් පීඩනකාරී තත්වයක හිඟ මුදල් සම්පූර්ණයෙන්ම පියවා ගැනීමට නොහැකි ව සිටි බැවින් පාඩු ලබන තත්ත්වය තිබියදීත් 2020 දී අලුත් කිරීම සිදු කරන ලදී. රටේ ප්‍රධාන අපනයනකරුවෙකු වීම, ජර්මනියේ GLS බැංකුවට සියයට 40 ක් හිමිවීම සහ සමාගමේ ආදායමෙන් සියයට 60 ක් යුරෝපීය රටවලින් ලැබීම හේතුවෙන් COVID බලපෑමෙන් පසු සමාගම ඔවුන්ගේ මූල්‍ය අර්බුදයෙන් මිදෙනු ඇතැයි අපේක්ෂාවෙන් අහිතකර මූල්‍ය තත්වයක් තිබියදීත් සමාගමට රු. මිලියන 100.0 ක පහසුකමක් ලබා දෙන ලදී.	
II. ඉහත සමාගමට ලබා දී ඇති පහසුකම් දීර්ඝ කිරීමට/චක්‍රීය කිරීමට BECC පත්‍රිකා අංක 119/2022, 818/2022, 882/2022, 111/2023, 396/2023 හරහා BECC හි අනුමැතිය ලබා දී ඇත. කෙසේ වෙතත්,	සමාගම තුළ මෙන්ම රටේ පැවති සහ පවතින අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් විකල්ප විසඳුමක් නොමැති නිසා සහ බොහෝ බාහිර සාධක පාරිභෝගිකයාගේ පාලනයෙන් ඔබ්බට වූ බැවින් ව්‍යාපාර ක්‍රියාත්මක වීමට ඉඩ සැලසීම සඳහා වරින් වර පහසුකම් දීර්ඝ කරන ලදී. සමාගම චේතාන්විත ණය පැහැර හරින ලද ණයකරුවෙකු නොවූ අතර අපගේ අපේක්ෂාව වූයේ ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමත් සමඟ ණය	

සේවා කාලය දීර්ඝ කිරීමෙන් බැංකුවල සහායත් සමඟ තත්වය ක්‍රමයෙන් දියුණු වනු ඇති බවයි.

(i.) බැංකුව විසින් තක්සේරු කරන ලද ණය අවදානම් ශ්‍රේණිගත කිරීම “B” සිට “C” දක්වා ක්‍රමයෙන් පිරිහී තිබුණි.

	ලකුණු	ශ්‍රේණිය
2020.05.21	42	B
2022.01.12	25	CC
2023.05.04	21	CC
2023.10.02	19	C

පහසුකම් දීර්ඝ කිරීම, පාඩු ලැබීම සහ ආපසු ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් අවදානම් ශ්‍රේණිගත කිරීම පිරිහී යන ලදී. සමාගමේ ආදායම සියයට සියයක් අපනයන නැඹුරු ආයතනයක් වන බැවින්, COVID 19 වසංගත තත්ත්වය එයට බෙහෙවින් බලපා ඇත.

(ii.) BECC පත්‍රිකාවල සඳහන් අවදානම් කළමනාකරණ සහ අනෙකුත් අංශවල සටහන් අනුව ආපසු ගෙවීමේ හැකියාව, ලාභදායීතාවය, ණය අවදානම් ශ්‍රේණිගත කිරීම, ශුද්ධ වටිනාකම සහ පොලී ආවරණ සේවා අනුපාතය (ICSR), ණය ආවරණ සේවා අනුපාතය (DCSR) වැනි අනෙකුත් මූල්‍ය දර්ශක සෑහීමකට පත් නොවන බව සඳහන් විය. කෙසේ වෙතත්, "විකල්පයක් නොමැත" යන පදනමින් ණය නිර්දේශ කර තිබුණි.

බොහෝ බාහිර සාධක ගනුදෙනුකරුගේ පාලනයෙන් ඔබ්බට පවතින බැවින්, ආපසු අයකර ගැනීමේ පදනම මත නිරාවරණය වැඩි කිරීමකින් තොරව පමණක් ණය සලකා බලා ඇත.

(iii.) ඉහත සඳහන් BECC පත්‍රිකා අංක 396/2023 හි 18 වන වගන්තිය අනුව, ප්‍රාදේශීය කළමනාකරුවන්ගෙන් තොග තක්සේරු වාර්තා ලැබීමට අපේක්ෂා කරන බවත්, සේවාදායකයා විසින් වත්කම් ප්‍රකාශන ඉදිරිපත් කර නොමැති බවත් සඳහන් විය. තවද, තොග පිහිටි පරිශ්‍රයන් වෙනත් බැංකුවලට උකස් කර ඇත. එබැවින්, සුරැකුම් වටිනාකම තහවුරු කිරීමකින් තොරව ණය පැකේජය අලුත් කිරීමට BECC තීරණය කර ඇති බව නිරීක්ෂණය විය.

පරීක්ෂාව කිරීමට නියමිතව තිබුණද, තොගය සහ ණයගැතියන්ගේ තත්ත්වය තක්සේරු කර පත්‍රිකාවේ සඳහන් කර ඇත.

සම්බන්ධතාවය ආරම්භයේ සිටම සමාගමේ නිර්මාතෘ සහ සභාපතිවරයා යම් ප්‍රමාණයකට වගකීම්වලට බැඳීමට හැකිවන පරිදි පුද්ගල ඇප ලබාගෙන ඇත. මූලික ප්‍රකාශය තිබියදීත්, පහසුකම අලුත් කිරීමේදී නව සහ සම්පූර්ණ වත්කම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස ඔහුට දැනුම් දුන්නෙමු. කෙසේ වෙතත්, නව ආයෝජනයක් සඳහා සාකච්ඡා කරන බවත් ආයෝජන මුදලින් මුළු අයවිය යුතු මුදල පියවීමට අදහස් කරන බවත් පවසමින් ඔවුන් එම යෝජනාව පිළිගත්තේ නැත. කෙසේ වෙතත්, සේවාදායකයා අපේක්ෂා කළ පරිදි

		එය සිදු නොවීය.	
(iv.)	2025 ජනවාරි 7 වන දින ණය ගැනුම්කරු ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ඇමරිකානු ඩොලර් මිලියන 6.5 ක නව මුදල් යෙදවීමක් ඉල්ලා ඇත. 2025 අප්‍රේල් 9 දිනැති නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අයකිරීම්) විසින් ණය ගැනුම්කරුට යැවූ පිළිතුරු ලිපියට අනුව, නැවත ගොඩනැගීමේ සැලැස්මක් සහ පවතින වගකීම් ආපසු ගෙවීමේ පිළිගත හැකි සැලැස්මක් සකස් කිරීම සඳහා, වගකීම් ව්‍යාපාර නැවත ගොඩනැගීමේ ඒකකයට මාරු කර ඇති බවත් නැවත ගොඩනැගීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන තෙක් නාමික ගෙවීමක් ලෙස සතිපතා රු. මිලියන 1 ක් තැන්පත් කරන ලෙස ණය ගැණුම්කරුගෙන් ඉල්ලා ඇත. කෙසේ වෙතත්, ලිපි හුවමාරු ගොනුවට අනුව, 2025 ජූලි 24 දින වන විට නැවත ගොඩනැගීමේ සැලැස්මක් හඳුන්වා දීම හෝ අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර නොමැති බව නිරීක්ෂණය විය.	ගනුදෙනුකරු අඛණ්ඩව රු. මිලියන 1.0 ක් ගෙවනු ලැබේ. 2025 අගෝස්තු 06 වන දින ව්‍යාපාර නැවත ගොඩනැගීමේ ඒකකය විසින් ණය අවදානම් කළමනාකරණ කමිටුවට පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර, ගනුදෙනුකරුගේ ඉල්ලීම සලකා බලා විගණිත මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම සඳහා 2025 ජූලි 02 සිට මාස දෙකක කාලයක් ලබා දෙන ලෙස දන්වා ඇත. 2025 සැප්තැම්බර් 02 වන දින දක්වා ගනුදෙනුකරුට රු.මිලියන 1.0 ක් ගෙවීමට අවසර දී ඇති අතර, එය සිදු නොවන්නේ නම් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කරනු ලැබේ.	
(v.)	ඉහත සමාගම සම්බන්ධයෙන් 2024 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 1,314.6 ක මුළු ලැබිය යුතු ශේෂයක් වාර්තා වී ඇති අතර, එයට ප්‍රාග්ධන අයවිය යුතු ශේෂය රු. මිලියන 1,090.4, උපචිත පොලී ශේෂය රු. මිලියන 216.5 ක සහ ප්‍රමාද ගාස්තු රු. මිලියන 7.7 ක් ඇතුළත්ය.	2025 අගෝස්තු 31 දිනට රු. මිලියන 1,380.6 ක මුළු අයවිය යුතු ශේෂයක් වාර්තා වී ඇති අතර එයට රු. මිලියන 1,076.2 ක ප්‍රාග්ධන ශේෂයක්, රු. මිලියන 292.9 ක උපචිත පොලියක් සහ රු. මිලියන 11.5 ක දඩ මුදලක් ඇතුළත් වේ. වර්තමානයේ, සමාගම සතිපතා රු. මිලියන 1.0 ක් ආන්තික ගිණුමට ගෙවන අතර වත්මන් ශේෂය රු. මිලියන 21.2 කි.	
1.5.3.13.	**ටෙක්නෝ පාර්ක් සංවර්ධන (පුද්ගලික) සමාගම වෙත ලබා දුන් ණය සම්බන්ධ නිරීක්ෂණ** 2021 සැප්තැම්බර් 24 දිනැති BP CR අංක 26/2021 අනුව 2021 සැප්තැම්බර් 06 දිනැති "තාක්ෂණික උද්‍යාන පිහිටුවීම" පිළිබඳ අංක 21/1641/301/020 දරන		ණය අනුමත කිරීමේ ක්‍රියාවලියේදී ගනුදෙනුකරු නිසි විමර්ශනය සහ ණය විශ්වාසනීයත්වය තක්සේරු කිරීම වැඩි දියුණු කිරීම

කැබිනට් පත්‍රිකාවට අදාළව, ගාල්ලේ ටෙක්නෝ පාර්ක් ව්‍යාපෘතිය සඳහා රු. බිලියන 6 ක යෝජිත කාලීන ණය පහසුකමෙන් රු. මිලියන 750 ක් සුරැකුම් රහිතව ටෙක්නෝ පාර්ක් සංවර්ධන (පුද්ගලික) සමාගම (SPV) වෙත නිදහස් කිරීමට 2021 සැප්තැම්බර් 27 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ණය ලබා දීමෙන් ආසන්න වශයෙන් මාස හයකට පසු කාලීන ණය පහසුකමේ සම්පූර්ණ වටිනාකම සහ කාලසීමාව ආවරණය වන පරිදි සුරැකුම් ලෙස භාණ්ඩාගාර ඇපකරයක් 2022 මාර්තු 29 වන දින ලබාගෙන තිබුණි.

පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(i.) ඉහත ණය මුදල ආපසු ගෙවීමේ මූලාශ්‍ර, ව්‍යාපෘති ශක්‍යතාව, මුළු ව්‍යාපෘති පිරිවැය, ආදායම් උත්පාදන මාර්ග සහ අතිරේක අරමුදල් සඳහා අයවැය ප්‍රතිපාදන පිළිබඳ කිසිදු සවිස්තරාත්මක විශ්ලේෂණයක් කිරීමකින් තොරව සුරැකුම් රහිතව මුදා හැර ඇත. තවද, ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර කිසිදු ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොමැත. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 715/2021 හි සඳහන් විස්තර වලට අනුව, ටෙක්නෝ උද්‍යානය පිළිබඳ පුළුල් යෝජනාවක් තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් 2021 ජූලි 30 වන දින පැවති රැස්වීමේදී බැංකුව ඉල්ලා තිබුණි. කෙසේ වෙතත්, අදාළ ණය ගොනුවේ එවැනි පුළුල් යෝජනාවක් නොතිබුණි.

අක්කර 31 ක රජයේ ඉඩමක් වසර 50 කට කල්බදු පදනම යටතේ හෝ සම්පූර්ණ වටිනාකම සහ කාලසීමාව ආවරණය වන පරිදි භාණ්ඩාගාර ඇපකරයක් / සහන ලිපියක් මත ගාල්ල ටෙක්නෝ පාර්ක් හි ඉඩමක් සහ ගොඩනැගිල්ලක් උකසට තබා රු. බිලියන 6.0 ක ණය මුදලක් ලබා දීමට මූලිකව අදහස් විය. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ විධිමත් ඇගයීම අවසන් වන තෙක් සුරැකුම් රහිතව රු.මිලියන 750.0 ක් කඩිනමින් ලබා දෙන ලදී. රු. බිලියන 6.0 ක පහසුකම ලබා දීම සිදු නොවූ බැවින්, මුදා හරින ලද ණය මුදලේ සම්පූර්ණ වටිනාකම සහ කාලසීමාව ආවරණය වන පරිදි භාණ්ඩාගාර ඇපකරයක් ලබා ගැනීම සඳහා බැංකුව මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කළ අතර මාස හයකට පසුව පවා බැංකුවේ බැදියාව තහවුරු කරමින් භාණ්ඩාගාර ඇපකරයක් ලබා ගැනීමට හැකිවිය.

ව්‍යාපෘතියේ රු. බිලියන 6.0 ක විධිමත් ඇගයීම අවසන් කරන තෙක් හදිසි අවශ්‍යතා සපුරාලීම සඳහා කෙටි කාලීන පහසුකමක් ලෙස රු. මිලියන 750.0 ක් ලබාදෙන ලදී.

මඟින් බැංකුවේ ස්ථාපිත චක්‍රලේඛ සහ මාර්ගෝපදේශවලට අනුකූලව සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම සහ අනාගත පැහැර හැරීම් අවම කිරීම සඳහා දැඩි අධීක්ෂණ සහ පසු විපරම් යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. බැංකුවේ අයකර ගැනීමේ උත්සාහයන් කඩිනම් කිරීම සඳහා තවදුරටත් නිර්දේශ කෙරේ.

(ii.)	ව්‍යාපෘති වාර්තාව, අපේක්ෂිත මුදල් ප්‍රවාහ, භාණ්ඩාගාර ඇපකරය හෝ භාණ්ඩාගාර සහතික වීමේ ලිපිය, ඔප්පුව සහ ගාල්ලේ පිහිටි දේපළෙහි අනුමත මිනින්දෝරු සැලැස්ම, වීදි රේඛා සහ පවරා නොගැනීමේ සහතිකය, පසුගිය වසර 25 සඳහා පත්තිරු සහ තක්සේරු වාර්තාව 2021 සැප්තැම්බර් 07 දිනැති ලිපිය හරහා බැංකුව ඉල්ලා සිටියද, මෙම ලේඛන කිසිවක් අදාළ ණය ගොනුවේ හමු නොවීය.	ඉහත පැහැදිලි කළ පරිදි, අපගේ ඉල්ලීම් කිහිපයක් තිබියදීත්, අවශ්‍ය තොරතුරු ඇගයීම සඳහා ඉදිරිපත් නොකළ අතර එම නිසා රු. බිලියන 6.0 ක පහසුකම ලබා දී නොමැත. පසුව භාණ්ඩාගාර ඇපකරයක් මඟින් ණය මුදල සම්පූර්ණයෙන්ම සුරක්ෂිත කරන ලදී.
(iii.)	ටෙක්නෝ පාර්ක් ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගමේ මෙහෙයුම් සක්‍රීය කර නොමැති අතර, සමාගම කළමනාකරණය කිරීමට අධ්‍යක්ෂවරුන් හෝ නිලධාරීන් නොමැති වුවද, සහන කාලය වරින් වර දීර්ඝ කර ඇත. තවද, ඉහත ණය මුදල 2024 දෙසැම්බර් 31 දිනට කිසිදු අයකර ගැනීමක් සිදු කර නොතිබුණද අක්‍රීය ණය (NPL) ලෙස වර්ගීකරණය කර නොතිබුණි.	මෙහෙයුම් ආරම්භ කිරීමෙන් පසු ව්‍යාපෘති මුදල් ප්‍රවාහයන්ගෙන් ණය සේවා කිරීම පිළිබඳ අවබෝධයෙන් ණය ලබා දෙන ලදී. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක නොවූ අතර එම නිසා මුදල් ප්‍රවාහයන් ජනනය වී නොවීය. එබැවින්, නියමිත දිනට ණය ආපසු ගෙවිය නොහැකි විය. කෙසේ වෙතත්, සම්පූර්ණ නිරාවරණය ආවරණය වන පරිදි වලංගු භාණ්ඩාගාර ඇපකරයක් (2029 පෙබරවාරි 28 දක්වා වලංගු) ඇති අතර ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පදනම්ව මුල් ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීමකින් තොරව ප්‍රාග්ධන සහ පොලී සහන කාලය 2025 ඔක්තෝබර් 31 දක්වා දීර්ඝ කර ඇත. එබැවින්, ණය අක්‍රීය ලෙස වර්ගීකරණය කර නැත. තවද, මහා භාණ්ඩාගාර නිලධාරීන් සමඟ මෑතකදී කළ සාකච්ඡාවට අනුව, එම වගකීම පියවීමේ හැකියාව සොයා බැලේ. කෙසේ වෙතත්, 2025 ජුනි 30 දිනට නිශ්චිත ගණනය කිරීම් මත පදනම්ව ණය අදියර 3 ලෙස වර්ගීකරණය කර ඇති අතර හානිකරණ ප්‍රතිපාදනය රු. මිලියන 288.60 කි.
(iv.)	ඉහත ණය මුදලට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 750 ක ප්‍රාග්ධන අයවිය යුතු	මෙම වගකීම පියවීමේ හැකියාව පිළිබඳ මහා භාණ්ඩාගාරය කටයුතු කරමින් සිටින අතර අදාළ

ශේෂය ද ඇතුලත්ව රු.මිලියන 1,231.6 ක මුළු අයවිය යුතු ශේෂයක් වාර්තා කර තිබුණි.

පාර්ශවයන් සමඟ රැස්වීම් කිහිපයක් පවත්වා ඇත. එවැනි සාකච්ඡා මත පදනම්ව, වගකීම නියමිත පරිදි පියවනු ඇති බව අපගේ අදහසයි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය බදු ගෙවීමට පෙර ලාභය රු. මිලියන 41,583.7 ක් වූ අතර ඊට අනුරූප පෙර වර්ෂයේ ලාභය රු. මිලියන 15,345.4 කි. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලය රු. මිලියන 26,238.3 කින් එනම් සියයට 171 කින් වැඩිවීමක් නිරීක්ෂණය විය. මෙම වැඩිවීමට ප්‍රධාන හේතුව පෙර වසරට සාපේක්ෂව පොලී වියදම් රු. මිලියන 98,423 කින් හෙවත් සියයට 28.9 කින් අඩු වීමයි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන්ගේ ප්‍රවණතා විශ්ලේෂණය

පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතම වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟ විශ්ලේෂණය පහත දැක්වේ.

විස්තරය	විචලතා වටිනාකම වැඩිවීම /(අඩුවීම) (රු.මිලියන)	විචලතාවයේ %	විචලතාවයට හේතු
පොලී ආදායම	(45,503)	(12.9)	ගනුදෙනුකරුවන්ගේ අත්තිකාරම් සහ රජයේ සුරැකුම්පත් සඳහා පොලී අනුපාත පෙර වසරට වඩා අඩු මට්ටමක පැවතුනි.
පොලී වියදම	(98,423)	(28.9)	තැන්පතු කළඹ නැවත මිල කිරීම.
සේවක වියදම්	11,341	46.3	2024-2026 වසර සඳහා නව සාමූහික ගිවිසුම අත්සන් කිරීම.

2.3 අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය සහ ඊට පෙර වර්ෂය සඳහා බැංකුවේ වැදගත් අනුපාත කිහිපයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද ආංශික අනුපාත හා සසඳා පහත දැක්වේ.

විස්තරය	ආංශික අනුපාතය	බැංකුව	
		2024	2023
කාර්යසාධන අනුපාත			
හිමිකම මත ප්‍රතිලාභ (ROE)	15.6	14.7	6.6
වත්කම් මත ප්‍රතිලාභ (ROA)	2.6	1.3	0.5
පොලී ආන්තිකය	4.3	3.4	1.8
වත්කම් ගුණත්ව අනුපාත			
හානිකරණය කරන ලද (අදියර	12.1	10.3	8.8

03) ණය අනුපාතය

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත			
ස්ථර 01 ප්‍රාග්ධනය (අවම 9.5%)	14.9	10.9	12.4
මුළු ප්‍රාග්ධනය (අවම 13.5%)	18.4	16.5	17.4
ව්‍යවස්ථාපිත අනුපාත			
ද්‍රවශීල ආවරණ අනුපාතය (අවම අවශ්‍යතාව 100%)	රුපියල් -340.9 සියලු මුදල් ඒකක - 288.4	රුපියල් – 353.9 සියලු මුදල් ඒකක – 279.5	රුපියල් – 256.7 සියලු මුදල් ඒකක – 207.9
ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (අවම අවශ්‍යතාව 100%)	164.8	178.9	164.3

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 ආර්ථික නොවන ගනුදෙනු

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස	නිර්දේශය
I. නිෂ්කාශන පද්ධති මෘදුකාංගයේ අනුවාදය **(version)** වැඩිදියුණු කිරීම. 2018 ජූලි 25 දිනැති EOC අංක 716/2018 දරන පත්‍රිකාවේ සඳහන් විස්තර වලට අනුව, IT දෙපාර්තමේන්තුව විසින් සංවර්ධනය කරන ලද පද්ධතියක් හරහා ශාඛා 194 ක නිෂ්කාශන කටයුතුද පුද්ගලික සමාගමක් විසින් සපයන ලද පද්ධතියක් හරහා ඉතිරි ශාඛා ද වශයෙන් බැංකුවේ නිෂ්කාශන පද්ධති මොඩියුලය පද්ධති දෙකක් හරහා සිදු කරන ලදී. පද්ධතියේ පැවති අඩුපාඩු සහ නව පද්ධතියක් මිලදී ගැනීමට වඩා පැවති පද්ධතිය වැඩිදියුණු කිරීමේ අඩු පිරිවැය හේතුවෙන්, නිෂ්කාශන මොඩියුලය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපත්තිමය අනුමැතිය EOC අංක 716/2018 දරන පත්‍රිකාව මඟින් ලබා දී ඇත. ඒ අනුව, 2020 ජූනි 30 දිනැති EOC අංක 568/2020 දරන පත්‍රිකාවේ තීරණය හරහා රු. 5,842,000 ක වියදමින් නිෂ්කාශන මොඩියුලය වැඩිදියුණු කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, පසුව නිෂ්කාශන මොඩියුලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අවසන් කිරීමට සහ ඒකාබද්ධ නිෂ්කාශන පද්ධතිය දිගටම කරගෙන යාමටත් පුද්ගලික සමාගමට ගෙවන ලද රු. 2,921,000 ක මුදල කපා හැරීමටත් විධායක මෙහෙයුම් කමිටුවේ (EOC) අනුමැතිය	2018 වර්ෂයේදී, නිෂ්කාශන ක්‍රියාවලියේ පැවති අඩුපාඩු පිළිබඳ විගණන සොයාගැනීම් නිවැරදි කිරීම සිදු වූ අතර, නිෂ්කාශන අනුවාදය වැඩිදියුණු කිරීමේ විෂය පථය එක් අංශයකට පමණක් සීමා විය. ඒ අවස්ථාවේ දී, අනෙකුත් නිෂ්කාශන අදියරවල සැලකිය යුතු වෙනස් කිරීමේ අවශ්‍යතා හඳුනාගෙන නොතිබූ බැවින්, නව සැපයුම්කරුවකුගෙන් මිලදී ගැනීමට වඩා පවතින සැපයුම්කරුගෙන් අනුවාද වැඩිදියුණු කිරීමක් ලබා ගැනීම සුදුසු විය. වසර 04 කට පසු, ශාඛා මට්ටමේ සමහර නිෂ්කාශන මෙහෙයුම් මධ්‍යගත කිරීමේ අවශ්‍යතාවය, තොරතුරු ආරක්ෂණ විගණන අවශ්‍යතා ආදියට අනුකූල වීම හේතුවෙන්, සමස්ත නිෂ්කාශන ක්‍රියාවලීන් (වත්මන් සහ අනාගත) ආවරණය වන පුළුල් පද්ධතියක් සලකා බැලීමේ අවශ්‍යතාවය මතු විය. බැංකුවට ප්‍රශස්ත ප්‍රතිලාභ ලබා	ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර, සම්පූර්ණ ශක්‍යතා අධ්‍යයන, පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණයන් සහ පැහැදිලිව අර්ථ දක්වා ඇති ව්‍යාපෘති කාලරාමු මඟින් බැංකුව තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති පාලනය ශක්තිමත් කිරීම නිර්දේශ කෙරේ. අනාගත තොරතුරු තාක්ෂණ ආශ්‍රිත සියලුම ප්‍රසම්පාදන, තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව විසින් තාක්ෂණික පිරිවිතර සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම ඇතුළුව අභ්‍යන්තර ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට දැඩි ලෙස අනුකූල විය යුතුය. තවද, අනවශ්‍ය ගෙවීම් වැළැක්වීම සඳහා ඉලක්ක පාදක ගෙවීම් ව්‍යුහයන් බලාත්මක කළ යුතු

2024 මාර්තු 19 දිනැති EOC අංක 368/2024 මගින් ලබා දී තිබුණි. පහත නිරීක්ෂණ සිදු කෙරේ.	ගැනීමේ අරමුණින් කාල පරිච්ඡේද දෙකක් (වසර 04 ක පරතරයක්) තුළ විවිධ විෂය පථ දෙකක් යටතේ බැංකුවේ නිලධාරීන් විසින් යෝජනා දෙක නිර්දේශ කර ඇත.	අතර, ආර්ථික නොවන වියදම්වලට හේතු වූ නොගැලපෙන නිර්දේශ සහ ව්‍යාපෘති අධීක්ෂණය ප්‍රමාණවත් නොවීම සඳහා වගවීම ස්ථාපිත කළ යුතුය.
(i.) 2020 ජුනි 10 දිනැති EOC අංක 568/2020 පත්‍රිකාවේ ඉදිරිපත් කරන ලද විස්තරවලට අනුව, මධ්‍යම පසුපෙළ කාර්යාලයේ වැඩබලන ජ්‍යෙෂ්ඨ කළමනාකරු, DGM ක්‍රියාවලි කළමනාකරණය, SDGM ශාඛා බැංකුකරණය සහ ප්‍රධාන තොරතුරු නිලධාරී විසින් නව පද්ධතියක් මිලදී ගැනීමට සාපේක්ෂව අනුවාද වැඩිදියුණු කිරීමේ වැදගත්කම පෙන්වා දී තිබුණි. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 01 දිනැති EOC අංක 1315/2022 පත්‍රිකාවේ විස්තරවලට අනුව, මධ්‍යම පසුපෙළ කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු, මධ්‍යම පසුපෙළ කාර්යාලයේ ප්‍රධාන කළමනාකරු, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී නාලිකා කළමනාකරණ සහ ප්‍රධාන තොරතුරු නිලධාරී විසින් පිරිවැය එලදායී බැවින් දැනටමත් සංවර්ධනය කරන ලද පද්ධතියක් මිලදී ගැනීමට කැමැත්ත පළකර ඇත.	මිලදී ගැනීමේ ඇණවුමේ එකඟ වී සඳහන් කර ඇති ගෙවීම් නියමයන් යටතේ මිලදී ගැනීමේ ඇණවුමේ වටිනාකමෙන් සියයට 50 ක් ගෙවීමට බැංකුවට සිදු වූ අතර එය සිදු කරන ලද කාර්යයේ කොටසට අදාළ නොවේ.කෙසේ වෙතත්, අතුරුමුහුණත් සංවර්ධනය කිරීමේදී ඇති වූ ගැටළු, මාර්ගගත තත්‍ය කාලීන ඇතුළත් කිරීම් පළ කිරීමේ ආකෘති සමඟ මූලික බැංකුකරණ පසුපෙළ සංවර්ධනයන් සහ සීමා ඉක්මවූ චෙක්පත් අනුමත කිරීම සඳහා පාරිභෝගික විස්තර (J පෝරම තොරතුරු) හේතුවෙන් ව්‍යාපෘතිය නිම කිරීම සියයට 25 ක් (AGM - ක්‍රියාවලි කළමනාකරණය සහ තත්ත්ව සහතික අනුව) ලෙස පැවතිණ.	
(ii.) 2023 ජනවාරි 13 දිනැති සහකාර සාමාන්‍යාධිකාරී - ක්‍රියාවලි කළමනාකරණ සහ තත්ත්ව සහතික විසින් ප්‍රධාන තොරතුරු නිලධාරියා වෙත යවන ලද විද්‍යුත් තැපෑලට අනුව, ව්‍යාපෘතියේ ප්‍රගතිය සියයට 25 ක් ලෙස සඳහන් කර ඇත. කෙසේ වෙතත්, මුළු පිරිවැයෙන් සියයට 50 ක් වන රු. 2,921,000 ක් ඉහත සමාගමට		

2020 ජූලි 28 දින ගෙවා ඇත. එබැවින්, තොරතුරු තාක්ෂණ අංශය විසින් අනුවාදය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් නිසි පසු විපරමක් සිදු කර තිබේද යන්න ගැටළු සහගතය.

(iii.) බැංකුව විසින් සපයන ලද ව්‍යාපෘති විස්තර අනුව, නිසි ශක්‍යතා අධ්‍යයනය, පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය, ව්‍යාපෘතියේ කාල රාමු පිළිබඳ සාක්ෂි නොතිබුණි.

නිෂ්කාශන ක්‍රියාවලිය සහිත පද්ධතියේ පැවති විගණන සොයාගැනීම් මඟින් හඳුනාගෙන තිබූ අඩුපාඩු නිවැරදි කිරීමක් ලෙස මෙම අනුවාදය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය මතු විය. එබැවින්, නිවැරදි කිරීම සඳහා බැංකුවට පිරිවැයක් දැරීමට සිදුවීම අත්‍යවශ්‍ය අවශ්‍යතාවයක් විය. එම අවස්ථාවේ දී, ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් නොතිබුණද, එම අවශ්‍යතා EOC පත්‍රිකාවේ ප්‍රමාණවත් ලෙස විස්තර කර ඇත.

අ) නිෂ්කාශන මොඩියුලයේ අනුවාදය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් සිදු කළ ශක්‍යතා අධ්‍යයනයක් පිළිබඳ කිසිදු සාක්ෂියක් නොතිබුණි. ඒ අනුව, ක්ෂේත්‍රයේ පරිවයන් තක්සේරු කර නිෂ්කාශන මොඩියුල හතරම ආවරණය වන පරිදි නව පද්ධතියක් ප්‍රසම්පාදනය කිරීමට හෝ අනුවාදය වැඩිදියුණු කිරීමේ ශක්‍යතාව පිළිබඳ බැංකුව තක්සේරු කර නොමැති බව නිරීක්ෂණය විය. එබැවින්, දැනටමත් දරන ලද රු. 2,921,000 ක පිරිවැය බැංකුව විසින් දරන ලද ආර්ථික නොවන වියදමක් බව පෙනී යයි.

විධිමත් ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් නොතිබුණද, EOC පත්‍රිකා අංක 568/2020 මඟින් ප්‍රධාන ගැටළු හඳුනා ගෙන අවශ්‍යතාවය තක්සේරු කරන ලදී. නිෂ්කාශන මොඩියුලයේ අනුවාදය වැඩිදියුණු කිරීම මඟින් පිරිනමන පද්ධති සැලසුම සහ ව්‍යුහය, ඒකාබද්ධ නිෂ්කාශන (four legs) පද්ධතියේ නිෂ්කාශන මොඩියුලයට සම්පූර්ණයෙන්ම අවශෝෂණය කර ගෙන ඇත. එමඟින් රු.මිලියන 2.9 ක (සියයට 50 ක අත්තිකාරම් ගෙවීමක්) පිරිවැයක් දරා තිබුණද සමාගමෙන් බැංකුව වක්‍රව තාක්ෂණික ප්‍රතිලාභ ලබාගෙන ඇත.

ආ) තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති මූල්‍යමය වශයෙන් ශක්‍ය බව, සංවිධානයේ ලාභදායිතාවයට දායක වීම සහ ආයෝජන මත ශක්තිමත් ප්‍රතිලාභයක් ලබා දීම යන කරුණු තහවුරු කර ගැනීමට පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය උපකාරී වේ. කෙසේ වෙතත්, ඉහත ව්‍යාපෘතිය සඳහා පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් නොතිබුණි.

එලෙසම පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් නම් වශයෙන් සිදු කර නොමැති අතර එවකට අවශ්‍යතාවය අනිවාර්ය වූ බැවින් බැංකුව විසින් පවතින ක්‍රියාවලියේදී ගැටළු විසඳා ගත යුතුව තිබුණි. කෙසේ වෙතත්, අනුවාදය වැඩිදියුණු කිරීම මිලදී ගැනීමේදී පිරිවැයට අදාළ කරුණු නිසි අනුමැතියක් සහිතව (EOC පත්‍රිකා අංක 568/2020) සලකා බලන ලදී.

	ඇ) තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතිවල පාලනය, කාර්යක්ෂමතාව සහ ගුණාත්මකභාවය පවත්වා ගැනීම සහ මෘදුකාංග මිලදී ගැනීම් ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික කිරීමට තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති සඳහා කාලරාමු ඉතා වැදගත් වේ.කෙසේ වෙතත්, ඉහත ව්‍යාපෘතිය සඳහා කාලරාමු නොතිබුණි.	යෝජනාවට ව්‍යාපෘති කාලරාමුවක් ඇතුළත් කර තිබුණද, අතුරුමුහුණත් සංවර්ධනය කිරීමේදී ඇති වූ ගැටළු හේතුවෙන් බැංකුවට එය නැවත සාක්ෂාත් කර ගැනීමට නොහැකි විය.
(iv.)	මහජන බැංකුවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 02 වන පරිච්ඡේදයේ 6.1 (ඇ) (ii) සහ 3.1 (ඊ) වගන්තිවලට අනුව, ප්‍රසම්පාදන කටයුතුවලට අදාළ පිරිවිතර තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව විසින් වෙන වෙනම සමාලෝචනය කර අනුමත කළ යුතුය. කෙසේ වෙතත්, එම උපදෙස්වලට අනුකූල වී ඇත්දැයි සනාථ කිරීමට කිසිදු සාක්ෂියක් නොතිබුණි.	පවතින පද්ධතිය වැඩිදියුණු කිරීම අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස සලකනු ලබන බැවින් මෙය ටෙන්ඩර් පටිපාටියක් හරහා ප්‍රසම්පාදනය කර නොමැති අතර තාක්ෂණික කමිටු ඇගයීමක් සිදු කර නොමැත.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස	නිර්දේශය
I.	බැංකු ක්ෂේත්‍රයේ අනෙකුත් සම තත්වයේ බැංකු හා සසඳන විට බැංකුවේ දළ ආදායම සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුනද, දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස ශුද්ධ පොලී ආදායම සාපේක්ෂව අඩු වන අතර 2024 දෙසැම්බර් 31 දිනට එය සියයට 29.1 ක් ලෙස වාර්තා විය. කෙසේ වෙතත්, අනෙකුත් බැංකු සඳහා ඉහත අනුපාතය සියයට 34.5 සිට සියයට 50.4 දක්වා පරාසයක පවතින බව වාර්තා විය.	2025 ජුනි 30 වන විට මෙම අනුපාතය සියයට 36.7 ක් විය. ආන්තිකයන් වැඩිදියුණු කිරීම සඳහා උපාය මාර්ග ලෙස නැවත මිල කිරීම සහ ගාස්තු ආදායම් පුළුල් කිරීම ඇතුළු පියවර ක්‍රියාත්මක වෙමින් පවතී.	සාපේක්ෂව අඩු ශුද්ධ පොලී ආදායමට දායක වන සාධක හඳුනා ගැනීම සඳහා බැංකුව එහි ආදායම් ව්‍යුහය සහ පිරිවැය කළමනාකරණ උපාය මාර්ග පිළිබඳ පුළුල් සමාලෝචනයක් සිදු කිරීම සහ ඒ අනුව සුදුසු පියවර ක්‍රියාත්මක කිරීම නිර්දේශ කෙරේ.
II.	තවද, 2024 දෙසැම්බර් 31 දිනට බැංකුවේ දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස ලාභය සියයට 6.8 ක් ලෙස වාර්තා වූ අතර බැංකු ක්ෂේත්‍රයේ අනෙකුත් සම තත්වයේ බැංකු සඳහා සියයට 13.3 සිට සියයට 21.7 දක්වා වාර්තා විය.	දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස ලාභය සියයට 9.6 ක් වූ අතර එය සම තත්වයේ බැංකු සඳහා සාමාන්‍ය අගය සියයට 13.4 සිට සියයට 18.2 දක්වා විය. දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස ලාභය ද සාපේක්ෂව අඩුය. මධ්‍ය කාලීනව ලාභදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, උපාය මාර්ග නැවත මිල කිරීම සහ ව්‍යාපාර විවිධාංගීකරණය කිරීම කෙරෙහි බැංකුව අවධානය යොමු කර ඇත.	
III.	අන්තර්ජාල ගෙවීම් ද්වාර (IPG) ව්‍යාපෘතිය ඇතුළුව ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරු (EFT) ස්විචය සහ කාඩ්පත් කළමනාකරණ පද්ධතිය (CMS) අන්තර්ජාල ගෙවීම් ද්වාර (IPG) ව්‍යාපෘතිය ඇතුළුව ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරු (EFT) ස්විච සහ කාඩ්පත් කළමනාකරණ පද්ධතිය (CMS) සඳහා අවශ්‍යතාවය 2012 මුල් භාගයේදී බැංකුව විසින් හඳුනාගෙන තිබුණි. අභිලාෂ කැඳවා යෝජනා 16 ක් ලැබී සැපයුම්කරුවන් 7 දෙනෙකු ලැයිස්තුගත කළත්, නව ATM ස්විච ව්‍යාපෘතිය මිලදී ගැනීම නවතා තිබුණි. එබැවින්, පැවති ස්විච දෘඩාංගවල ආයු කාලය අවසන් වීම හේතුවෙන්		බැංකුව ශක්තිමත් පූර්ව ව්‍යාපෘති ඇගයීමේ ක්‍රියා පටිපාටි, ඉලක්කගත නිරීක්ෂණය සමඟ දැඩි කාලරාමු ක්‍රියාත්මක කළ යුතු අතර ව්‍යාපෘති විෂය පථය, ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග සහ අනුමැතීන් නිසි ලෙස පෙළගැස්වීම සහතික කළ යුතුය. එසේම, දිගුකාලීන ප්‍රමාදයන් සඳහා බැංකුව පැහැදිලි වගවීමක් ස්ථාපිත කළ යුතු අතර එවැනි පිරිවැය සහිත අකාර්යක්ෂමතා නැවත ඇතිවීම වළක්වා ගැනීම සඳහා හොඳින් නිර්වචනය කරන ලද අවශ්‍යතා, නිසි ලෙස

වැඩිදියුණු කර, 2015 ජුනි මාසයේදී වසර 3 ක වගකීමක් සහිතව රු. මිලියන 224.9 කට ටැන්ඩම් NS සේවාදායක (servers) දෙකක් මිලදී ගන්නා ලදී. තවද, දෘඩාංග සඳහා වසර 3 කට දේශීය සහාය ගාස්තු රු. මිලියන 13.8 ක් වූ අතර ඒ අනුව මුළු පිරිවැය රු. මිලියන 238.7 කි.

2016 දී බැංකුව ස්වයං බැංකුකරණ ඒකක (SBU) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ අතර, අරමුදල් මාරු කිරීම්, උපයෝගිතා බිල්පත් ගෙවීම්, ජංගම ටොප් අප්, තැන්පතු, බිල්පත් ගෙවීම් සම්බන්ධයෙන් Kiosk සහ CDM සඳහා පහසුකම් සැලසීමට ATM ස්විචය අපොහොසත් වීම හේතුවෙන් ATM ස්විචය බාහිරින් ලබා ගැනීම සඳහා වසර 5 ක ගිවිසුමක් අත්සන් කරන ලදී. වසර 8 කට පසු දෙවන වරටත් IPG ඇතුළුව නව EFT ස්විචය සහ CMS මිලදී ගැනීම සඳහා බැංකුව 2020 ජනවාරි මාසයේදී ටෙන්ඩර් අංක RFP 03-2020 යටතේ ටෙන්ඩර් ක්‍රියාවලිය ආරම්භ කර තිබුණි. ඉන්පසුව, දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ලංසුකරුවන් වැඩිප්‍රමාණයකගෙන් යෝජනා ලබා ගැනීම සඳහා අභිලාෂ කැඳවීම සංශෝධනය කර ඇති අතර, 2021 ජනවාරි 01 වන දින තුන්වන වරටත් ටෙන්ඩර් අංක 01-2021 යටතේ ටෙන්ඩරය ප්‍රකාශයට පත් කර අභිලාෂ කැඳවා ඇත. පැවති ගැටළු හේතුවෙන් 2021 අගෝස්තු 01 වන දින සිව්වන වරටත් අන්තර්ජාල ගෙවීම් ද්වාරය (IPG) (සම්පූර්ණ විසඳුම) ඇතුළුව ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරු ස්විචය (EFT ස්විචය) සහ කාඩ්පත් කළමනාකරණ පද්ධතියක් (CMS) සැපයීම, ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම සඳහා දේශීය හා විදේශීය සැපයුම්කරුවන්ගෙන් අභිලාෂ කැඳවා ඇත.

කෙසේ වෙතත්, විෂය පථ තුනක් (නව EFT ස්විචය, CMS සහ IPG) සඳහා ටෙන්ඩර් කැඳවා ඇතත්, CMS සහ IPG සම්බන්ධයෙන් දැනටමත් මූලපිරීම් ගෙන ඇති බව EOC හඳුනාගෙන ඇත.

ලේඛනගත කරන ලද සාධාරණීකරණයන් සහ පාර්ශවකරුවන්ගේ ඵලදායී සම්බන්ධීකරණය මඟින් අනාගත ප්‍රසම්පාදන මෙහෙයවනු ලබන බව සහතික කළ යුතුය.

එබැවින්, 2021 ජුනි 01 වන දින (EOC අංක 730/2021) පැවති කමිටු රැස්වීමේදී නව EFT ස්විචයක අවශ්‍යතාවය සමඟ පමණක් ඉදිරියට යාමට තීරණය කළ අතර TEC එය සලකා බැලිය යුතුය. තවද, ප්‍රයිම් 4 පද්ධතිය ක්‍රියාත්මක වීම සමඟ IPG අවශ්‍යතාවය මෙන්ම CMS හි ක්‍රෙඩිට් කාඩ් කළමනාකරණයද දැනටමත් සපුරා ඇති බැවින් EFT ස්විචයට අදාළව මිලදී ගැනීමේ ක්‍රියාවලිය සහ හරකාඩ්පත් කළමනාකරණය සඳහා පමණක් CMS යොදා ගැනීමට 2021 ජූලි 30 වන දින පැවති ඔවුන්ගේ රැස්වීමේදී තීරණය කර ඇත. කෙසේ වෙතත්, RFP 05-2021 යටතේ IPG ඇතුළුව සම්පූර්ණ විසඳුමක් සඳහා ටෙන්ඩරය ප්‍රකාශයට පත් කරන ලද බව නිරීක්ෂණය විය. ඉන්පසුව, "ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරු ස්විචයක් සහ කාඩ්පත් කළමනාකරණ පද්ධතියක් සැපයීම, ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම" ලෙස අවශ්‍යතාවය වෙනස් කරමින් ටෙන්ඩර් සඳහා අතිරේක ඉදිරිපත් කරන ලද අතර IPG (සම්පූර්ණ විසඳුම) අවශ්‍යතාවය ඉවත් කරන ලද අතර අතිරේකය 2021 අගෝස්තු 03 වන දින ප්‍රකාශයට පත් කරන ලදී.

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(i.) මුලින් 2016 දී වසර පහකට අත්සන් කරන ලද නව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ස්විචය බාහිරින් ලබා ගැනීමේ ගිවිසුම කල් ඉකුත් වූ පසු, බැංකුවට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ස්විචයක් අත්පත් කරගන්නා තෙක් සියලුම බාහිරින් ලබා ගත් යන්ත්‍ර ක්‍රියාත්මක කරගැනීම සඳහා තවත් වසර 5 කට ගිවිසුම අලුත් කර ඇත. ඒ අනුව, නිසි ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ස්විචයක් නොමැති වීම හේතුවෙන් 2017 සිට 2024 දක්වා අදහස සටහන් කර ගන්නා ලදී. ව්‍යාපෘතියේ සංකීර්ණත්වය හේතුවෙන් සාමාන්‍යයෙන් ATM ස්විචයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවම වශයෙන් වසර දෙකක කාලයක් ගතවේ. එතෙක්, මුදල් recycling යන්ත්‍ර (CRM) සහ මුදල් තැන්පතු යන්ත්‍ර (CDM) වලට සහාය වීම සඳහා ATM ස්විචය නඩත්තු කළ යුතුය. මෙම අවශ්‍යතාවය මත පදනම්ව,

	බාහිරින් ලබා ගත් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ස්විචය සඳහා පිරිවැය ලෙස බැංකුව විසින් රු. මිලියන 9,466 ක් ගෙවා තිබුණි.	බැංකුවේ කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව, පැවති ගිවිසුම තවත් වසර පහකට අලුත් කිරීමට තීරණය කරන ලදී.
(ii.)	තවද, නව ATM ස්විචයකට යාමට නොහැකි වීම හේතුවෙන් පවතින COSES පද්ධතිය සහ ටැන්ඩම් සේවාදායක (servers) සඳහා 2018 සිට 2024 දක්වා බැංකුව විසින් රු. මිලියන 726.8 ක් ගෙවා තිබුණි.	මෙම මිලකිරීම 2015 වර්ෂයේදී එකඟ වී ඇති අතර මිලදී ගැනීමේදී වසර 10 ක කාලයක් සඳහා මණ්ඩලය විසින් අනුමත කරන ලද බව කරුණාවෙන් සලකන්න. පැරණි ස්විචය භාවිතා කරන තෙක් පද්ධතිය ක්‍රියාත්මකව තබා ගැනීම සඳහා නඩත්තු ගාස්තු ගෙවීමට අපට සිදුවේ.
(iii.)	ටෙන්ඩර් අංක RFP 05-2021 ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරු ස්විචයක් සහ කාඩ්පත් කළමනාකරණ පද්ධතියක් සැපයීම, ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කෙරේ.	
	අ) පෙර අවලංගු කරන ලද ටෙන්ඩර් සඳහා භාවිතා කරන ලද (RFP 03-2020 සහ RFP 01-2021) 2020 ජනවාරි 21 දින අනුමත කරන ලද ව්‍යාපෘති අනුමැතිය ඉල්ලීම (PAR), ටෙන්ඩර් අංක RFP 05 සඳහාද PAR ලෙස භාවිතා කර ඇත. කෙසේ වෙතත්, අදාළ වර්ෂයේ අයවැය සමඟ පෙළගැස්වීම සඳහා ව්‍යාපෘතියේ විෂය පථයේ වෙනස්කම් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව සාමාන්‍යයෙන් ටෙන්ඩර් අවලංගු කිරීමකින් සහ ආපසු කැඳවීමකින් පසු සංශෝධිත කොන්දේසි අනුව ඉදිරියට යාමට පෙර ව්‍යාපෘතිය නිසි ලෙස අවසර දී ඇති බව සහතික කිරීමට නව PAR අවශ්‍ය වේ.	නිශ්චිත අවස්ථාවක ව්‍යාපෘතියක් සඳහා අයවැය ප්‍රතිපාදන අනුමත කිරීම සඳහා පමණක් ව්‍යාපෘති අනුමැතිය ඉල්ලීම (PAR) අවශ්‍ය වේ. ඒ අනුව, අනුමත PAR භාවිතා කිරීමකින් තොරව ටෙන්ඩර් අවලංගු කරන ලද බැවින්, RFP 05/2021 සඳහා මූලිකව භාවිතා කළ PAR භාවිතා කරන ලදී. 2021 ජූලි 30 දින විධායක මෙහෙයුම් කමිටුව විසින් සපයන ලද මග පෙන්වීම මත පදනම්ව ව්‍යාපෘති විෂය පථය පසුව වෙනස් කරන ලදී. කෙසේ වෙතත්, PARහි අරමුණ අයවැය අනුමැතියට පමණක් සීමා වූ බැවින් එය සංශෝධනය නොකරන ලදී.
	ආ) 2021 ඔක්තෝබර් 06 වන දින ටෙන්ඩරය විවෘත කරන ලද අතර යෝජනා 09 ක් ලැබී තිබුණි. ඇගයීමේ ක්‍රියාවලියෙන් පසු, 2023 ජනවාරි 24 වන දින EFT ස්විචය	අදහස් සටහන් කර ගන්නා ලදී. ක්‍රියාවලියේ ප්‍රමාදය හේතු කිහිපයක් නිසා සිදු වූ අතර ඉන් සමහරක් බැංකුවේ පාලනයෙන් ඔබ්බට විය. ප්‍රසම්පාදනය සිදුවූ කාලය අතරතුර අත්විඳින ලද ආර්ථික පසුබෑම

සහ කාඩ් කළමනාකරණ පද්ධතිය මිලදී ගැනීම සඳහා මිලදී ගැනීමේ ඇණවුමක් නිකුත් කර ඇති අතර, ඒ අනුව ටෙන්ඩර් ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා බැංකුව වසර 1 යි මාස 3 ක් ගත කර ඇති බව නිරීක්ෂණය විය. ව්‍යාපෘතියේ කාල පරිමාණය මාස 8-10 ලෙස PAR හි සඳහන් කර තිබුණද, එම කාලය තුළ ප්‍රසම්පාදනය සම්පූර්ණ කිරීමට බැංකුවට නොහැකි විය. තවද විගණනය සඳහා කිසිදු ප්‍රසම්පාදන කාලසටහනක් ඉදිරිපත් නොවීය.

ප්‍රමාදයට ප්‍රධාන සාධකයක් විය. ඊට අමතරව, ව්‍යාපෘතියේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් තාක්ෂණික ඇගයීම් කමිටුව යෝජනා මාස 7 ක පමණ කාලයක් තුල බොහෝ අංශවලින් ඇගයීමට ලක් කළ අතර සැලකිය යුතු අගය එකතු කිරීමක් සිදු කිරීමට හැකි විය.

ටෙන්ඩර් ක්‍රියාවලියේදී ඇති වූ බාහිර ගැටළු සහ ආර්ථික අර්බුදය හේතුවෙන්, මාස 8 - 10 කාලසටහන සපුරාලීමට නොහැකි වූ අතර 2021 දී ප්‍රසම්පාදන කාලසටහනට අනුකූල වීමට නොහැකි විය. ප්‍රසම්පාදන අත්පොතෙහි නව සංශෝධනයෙන් පසු මිලදී ගැනීමේ ඉල්ලීම් පෝරමය ඉදිරිපත් කරන අවස්ථාවේ ප්‍රසම්පාදන කාලසටහන එකතු කර ඇත.

ඇ) PAR හි 11 වන කරුණට අනුව, පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය PAR සමඟ අමුණා තිබිය යුතුය. විධායක මෙහෙයුම් කමිටුව PAR අනුමත කළද, පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

අදහස් සටහන් කර ගන්නා ලදී. පැවති ස්විචයේ තාක්ෂණික සීමාවන් සහ පවතින වෙළඳපල තරඟකාරිත්වය හේතුවෙන්, නව ATM ස්විචයක් සඳහා යාමට මහජන බැංකුවට සිදු විය. මෙය දැනටමත් මහජන බැංකුවේ වාර්ෂික අයවැය යටතේ අයවැයගත කර තිබුණි.

ඇ) බැංකුව විසින් සපයන ලද තොරතුරු වලට අනුව, ව්‍යාපෘතිය අදියර දෙකක් ලෙස සංවර්ධනය කිරීමට නියමිත වූ අතර අදියර 1 හි සත්‍ය ආරම්භක දිනය 2024 ජනවාරි 16 විය. ඒ අනුව, මිලදී ගැනීමේ ඇණවුම නිකුත් කිරීමෙන් පසු ව්‍යාපෘතිය ආරම්භ කිරීමට වසරක් පමණ ගත වූ බව නිරීක්ෂණය විය. තවද, ක්‍රියාකාරී පිරිවිතර ලේඛනය (Functional Specification Document) (FSD) 2024 මැයි 09 වන දින අත්සන් කර ඇති අතර මිලදී ගැනීමේ ඇණවුම නිකුත් කළ දින සිට FSD අත්සන් කිරීමට

මිලදී ගැනීමේ ඇණවුම් දිනයේ සිට වැඩ ප්‍රකාශන (Statement Of Work) ගිවිසුම අවසන් කර අත්සන් කිරීම දක්වා, SOW අන්තර්ගතය සහ ගිවිසුම් කොන්දේසි සම්පූර්ණ කිරීම සඳහා සැලකිය යුතු කාලයක් අවශ්‍ය විය. ගිවිසුම 2023 ජුනි 28 වන දින අත්සන් කරන ලද අතර, FSD සාකච්ඡා 2023 අගෝස්තු 01 වන දින ආරම්භ විය.

FSD නිසි සැලකිල්ලෙන් සිදු නොකළේ නම්, පසුව වෙනස් කිරීමේ ඉල්ලීම් (CRs) ලෙස අවශ්‍යතා මතුවීමේ ඉහළ සම්භාවිතාවක් ඇති අතර එමඟින් අමතර පිරිවැයක් දැරීමට සිදුවිය

සැලකිය යුතු කාලයක් (වසරක් සහ මාස 04 ක් පමණ) ගත වී තිබුණි.	හැකිය. එබැවින්, සියලු අවශ්‍යතා හොඳින් ග්‍රහණය කර ඇති බව සහතික කිරීම සඳහා විවිධ සමාලෝචන චක්‍ර පවත්වන ලදී. ටෙන්ඩරය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, ව්‍යාපෘතිය 2023 ජූලි 31 වන දින ආරම්භ කර 2023 නොවැම්බර් 30 වන දින අවසන් කිරීමට මුලින් සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, තාක්ෂණික ගැටළු නිසි ලෙස හඳුනා ගැනීම සහ විසඳීමේ අවශ්‍යතාවය මෙන්ම ව්‍යාපෘතියේ සමස්ත සංකීර්ණත්වය හේතුවෙන් FSD අදියර සැලසුම් කළ කාලරාමුව ඉක්මවා යන ලදී.
ඉ) විගණිත දිනය වන 2024 නොවැම්බර් 14 දිනට, අදියර 1 න් සියයට 12 ක් සම්පූර්ණ කර ඇති අතර අපේක්ෂිත සජීවී දිනය 2025 මාර්තු 04 වේ. තවද අදියර 02, 2025 මාර්තු 03 වන දින ආරම්භ වී 2025 නොවැම්බර් 17 වන දින සජීවී වීමට අපේක්ෂා කෙරේ. එබැවින්, ව්‍යාපෘතිය අපේක්ෂිත පරිදි අවසන් වුවහොත්, ටෙන්ඩරය ප්‍රකාශයට පත් කළ දින සිට සජීවී වීමට වසර 4 යි මාස 3 ක් පමණ ගතවනු ඇත.	දැනට, පළමු අදියර සාර්ථකව නිම කර සජීවීව ක්‍රියාත්මක කර ඇත. දෙවන අදියර ඉදිරි මාස තුන ඇතුළත අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.
ඊ) ඉහත කරුණු වලට අනුව, බැංකුව 2012 දී නව ATM ස්විචයේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණද, වසර 12 ක් පුරා එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත් ව්‍යාපෘතිය අවසන් වන විට වසර 13 කට වඩා ගතවනු ඇති බවත් නිරීක්ෂණය විය. තවද මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කිසිදු ශක්‍යතා අධ්‍යයනයක් විගණනය වෙත ලබා ගත නොහැකි විය.	ව්‍යාපෘති කාලරාමුවට අනුව, මිලදී ගැනීමේ ඇණවුම නිකුත් කිරීමෙන් පසු ව්‍යාපෘතිය ආරම්භ වේ. ගිවිසුම 2023 ජුනි 28 වන දින අත්සන් කරන ලද අතර, 2023 මැයි 09 වන දින SOW සහ ගිවිසුම අත්සන් කරන ලදී. අවශ්‍යතාවල ශක්‍යතාව හඳුනා ගැනීම සඳහා විස්තරාත්මක ක්‍රියාකාරී විසඳුම් සැලසුම් (Functional Solution Design) ලේඛනයක් සකස් කරන ලදී. මෙම ක්‍රියාවලියට පැහැදිලි බව සහ නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා අදාළ සියලුම මෙහෙයුම් දෙපාර්තමේන්තු සමඟ පුළුල් සාකච්ඡා ඇතුළත් විය. 2024 අප්‍රේල් 26 වන දින FSD අත්සන්

කරන ලදී.

ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් ලෙස ව්‍යාපාරික දෙපාර්තමේන්තු සමඟ සහයෝගයෙන් සකස් කරන ලද පුළුල් RFP ගත හැක. පැවති ස්විචයේ තාක්ෂණික සීමාවන් සහ පවතින වෙළඳපල තරඟකාරිත්වය හේතුවෙන්, මහජන බැංකුවට නව ATM ස්විචයක් සමඟ ඉදිරියට යාමට සිදුවිය. බැංකුවේ වාර්ෂික අයවැය යටතේ මේ සඳහා අයවැයගත කර ඇත.

නව ස්විචයේ මුළු වාර්ෂික පිරිවැය සැලකිය යුතු පිරිවැය ඉතිරියක් ඇති කරයි. පැවති ස්විචය එහි ආශ්‍රිත නඩත්තු වියදම් සමඟ නතර කරනු ලැබේ. පළමු වසර තුන නඩත්තු ගාස්තු වලින් තොර බැවින්, වසර තුනකට පසු ස්විචයේ නඩත්තු පිරිවැය වත්මන් ස්විචයේ නඩත්තු පිරිවැයට වඩා ආසන්න වශයෙන් සියයට 40 කින් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. නව ස්විචය වසර 10 ක පිරිවැය සැලැස්මක් යටතේ ක්‍රියාත්මක කෙරේ. තවද, TSYS නඩත්තුව යටතේ දැනට දරනු ලබන හරකාඩ්පත් කළමනාකරණ වියදම් ද නව ස්විචය ක්‍රියාත්මක කිරීමත් සමඟ නතර කරනු ලැබේ.

3.3 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස	නිර්දේශය
2024 අගෝස්තු 13 දිනැති විධායක මෙහෙයුම් කමිටු (EOC) අංක 975/2024 දරන පත්‍රිකාවේ තීරණයට අනුව, ආන්තික ගිණුමේ තිබූ මුදල් අයකර ගැනීමෙන් හිටපු සාමාන්‍යාධිකාරීවරයා විසින් භාවිතා කරන ලද ලැප්ටොප් පරිගණකය බැහැර කිරීමට අනුමත කරන ලදී. කෙසේ වෙතත්, EOC අංක 1130/2024 සහ EOC අංක 1465/2024 දරන තීරණයට අනුව, බැංකුවේ විශ්‍රාමික නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් දෙදෙනෙකුට අයිපෑඩ් දෙකක් ලබා දී තිබුණි.	විධායක මෙහෙයුම් කමිටුවේ (EOC) අංක 1130/2024 සහ 1465/2024 යන තීරණවලට අනුව අදාළ ලැප්ටොප් පරිගණක ලබා දී ඇත.	විශ්‍රාම යාමේදී නිල උපාංග බැහැර කිරීම පිළිබඳ පැහැදිලි, ප්‍රමිතිගත ප්‍රතිපත්තියක් අවශ්‍ය නම් බැංකුව විසින් සකස් කර ක්‍රියාත්මක කළ යුතු අතර, එවැනි බැහැර කිරීමට පෙර එවැනි ප්‍රතිපත්තියක් සඳහා අමාත්‍යාංශ මට්ටමේ අනුමැතිය ලබා ගත යුතුය. තවද, දැනටමත් බැහැර කර ඇති අයිපෑඩ් 2 සඳහා මණ්ඩලයෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතුය.

3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස	නිර්දේශය
3.4.1 ප්‍රසම්පාදන කාලසටහන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 4.2.2 වගන්තියට අනුව, ප්‍රසම්පාදන කාලසටහන (PTS) යනු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාව ආරම්භයේ සිට එය අවසන් වන තෙක් කාලානුක්‍රමික අනුපිළිවෙලින් විස්තර කරන සටහනකි. තවද, ප්‍රසම්පාදන කාලසටහනට ආරම්භයේ සිට කෙටුම්පත් ලංසු ලේඛන ප්‍රමාදයකින් තොරව සකස් කිරීම දක්වා සියලුම ක්‍රියාකාරකම් ඇතුළත් වන අතර ලංසු ලේඛන සකස් කිරීමෙන් පසු සියලුම ක්‍රියාකාරකම්ද ඇතුළත් වේ. බැංකු ප්‍රසම්පාදන අත්පොතේ 02 වන පරිච්ඡේදයේ 3(ඉ) වගන්තියට අනුව, සැලසුම් කළ පරිදි කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා ප්‍රසම්පාදන කාලසටහන (PTS) සමාලෝචනය කිරීම සහ එකඟ වීම ප්‍රසම්පාදන කමිටුවේ වගකීමකි. 02 වන පරිච්ඡේදයේ 6(ඈ)(I) වගන්තියට අනුව, අවම කාල සීමාව තුළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව අදාළ ප්‍රසම්පාදන කාලසටහන නිර්දේශ කර එකඟ විය යුතුය. තවද, ක්‍රියා පටිපාටි අත්පොතේ 1.9.26 වගන්තියට අනුව (2023 නොවැම්බර් 01 දින සිට ක්‍රියාත්මක), ප්‍රධාන කළමනාකරු (සැපයුම්) ප්‍රසම්පාදන ඉල්ලීම සමඟ ප්‍රසම්පාදන කාලසටහන ලබා දිය යුතු අතර ප්‍රසම්පාදන නිලධාරියා ලබා දී ඇති PTS අනුව මිලදී ගැනීම් සැලසුම් කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන කාලසටහන (PTS) විගණනයට ඉදිරිපත් නොකළ අතර ව්‍යාපෘති අවසර ඉල්ලීමේ 8 වන වගන්තිය (උදා: මාස 6) යටතේ ව්‍යාපෘතියේ කාල පරිමාණයන් පමණක් සඳහන් විය.	බැංකුව සතුව මණ්ඩලය විසින් අනුමත කරන ලද වෙනම ප්‍රසම්පාදන අත්පොතක් ඇත. ඒ අනුව සැපයුම් දෙපාර්තමේන්තුව විසින් මිලදී ගැනීම ආරම්භයේදී මිලදී ගැනීමේ ඉල්ලීම් පෝරමයට ප්‍රසම්පාදන කාලසටහන ඇතුළත් කර ඇත. ප්‍රසම්පාදන කළමනාකරු විසින් ප්‍රසම්පාදනයේ ස්වභාවය සැලකිල්ලට ගනිමින් ප්‍රසම්පාදන කාලසටහන සඳහන් කරන අතර එය ප්‍රසම්පාදන අත්පොතේ 1.9.26 ට අනුකූලව ප්‍රධාන කළමනාකරු සැපයුම් විසින් අනුමත කරයි.	ප්‍රසම්පාදන කාලසටහන සකස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඒ අනුව කටයුතු කරන්න.
3.4.2 ඩෙස්ක්ටොප් පරිගණක යන්ත්‍ර 02 ක් මිලදී ගැනීම– ටෙන්ඩර් අංක - පීබී/එස්යූ/කිච්ඊ/09/23/172 2023 පෙබරවාරි 20 දින ගොඩනැගිලි		ප්‍රසම්පාදන කටයුතුවලට අදාළව ස්ථාපිත කර ඇති සියලුම මාර්ගෝපදේශ සහ චක්‍රලේඛවලට

ඉංජිනේරු සේවා ප්‍රධානී විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (BSS) මඟින් තොරතුරු තාක්ෂණ ප්‍රධානීගෙන් අලුත් කරන ලද බලපත්‍රලාභී මෘදුකාංග පැකේජයකට අනුකූල වන පරිදි නව ඩෙස්ක්ටොප් පරිගණක යන්ත්‍ර වැඩිදියුණු කිරීමට හෝ ලබා දීමට, පිරිවිතරයක් සමඟ ඉල්ලීමක් කර තිබුණි. ඉහත ඉල්ලීම ප්‍රධාන තොරතුරු නිලධාරී (CIO) වෙත 2023 පෙබරවාරි 21 වන දින, IT දෙපාර්තමේන්තුවට 2023 පෙබරවාරි 23 වන දින, BSS දෙපාර්තමේන්තුවට 2023 අගෝස්තු 17 වන දින සහ සැපයුම් දෙපාර්තමේන්තුවට 2023 අගෝස්තු 18 දින ලැබී තිබුණි. ඉහත ඉල්ලීමට අමතරව, 2023 සැප්තැම්බර් 20 වන දින ගොඩනැගිලි ඉංජිනේරු සේවා ප්‍රධානී විසින් “24” ප්‍රමාණයේ මොනිටර් 02 ක් ඉල්ලා තිබුණි. ඒ අනුව, 2023 ඔක්තෝබර් 03 දින විද්‍යුත් ප්‍රසම්පාදනය හරහා නව ඩෙස්ක්ටොප් පරිගණක දෙකක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා තිබුණි. පහත නිරීක්ෂණ සිදු කෙරේ.		අනුකූල වීමෙන් ප්‍රසම්පාදන පාලනය ශක්තිමත් කිරීම සහ බැංකුවේ අරමුදල් ප්‍රසම්පාදනය සඳහා ඵලදායී ලෙස භාවිතා කරන බව සහතික කිරීම නිර්දේශ කෙරේ.
I. ප්‍රසම්පාදන, සැපයුම්, ගබඩා සහ තොග පාලනය සඳහා වූ ක්‍රියා පටිපාටි අත්පොතේ 6.1.(අ) වගන්තියට අනුව (2017 නොවැම්බර් 22 සිට ක්‍රියාත්මක) තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් (TEC) ලංසු කැඳවීමට පෙර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සඳහා පිරිවිතර නිර්දේශ කළ යුතුය (වර්තමානයේ රු. මිලියන 2.0 ට වැඩි මිලදී ගැනීම් සඳහා). කෙසේ වෙතත්, 2023 ඔක්තෝබර් 19 වන දින ලංසු ලැබීමෙන් පසු TEC පත් කර ඇත. 2023 නොවැම්බර් 17 වන දින පැවති රැස්වීමේදී, පිරිවිතර නොගැලපෙන බැවින් මිල ගණන් අවලංගු කර නැවත කැඳවීමට TEC උපදෙස් ලබා දී තිබුණි.	අදහස් සටහන්කර ගන්නා ලදී. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිරිවිතර සමාලෝචනය නොකර මූලික මිල ගණන් කැඳවා තිබුණි. පිරිවිතර සමාලෝචනය හා අනුමත කිරීමෙන් පසු ලැබුණු යෝජනා බැංකුවේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන බැවින්, මිල ගණන් අවලංගු කර ආපසු කැඳවීමට තාක්ෂණික කමිටුව උපදෙස් දී ඇත. ඒ අනුව, සැපයුම් දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සමාලෝචනය කරන ලද සංශෝධිත පිරිවිතරයන්ට මිල ගණන් කැඳවා ඇත.	
II. 2023 පෙබරවාරි 20 දිනැති ගොඩනැගිලි ඉංජිනේරු සේවා	පිරිවිතර සමාලෝචනය කරන අවස්ථාවේදී, 16GM RAM ප්‍රමාණවත් බව TEC තීරණය කර ඇති අතර අනාගත	

	ප්‍රධානීගේ ඉල්ලීම පරිදි, 64 GB හෝ ඊට වැඩි තාවකාලික මතකයක් (RAM) ඉල්ලා තිබුණි. කෙසේ වෙතත්, පළමු නැවත කැඳවීම සඳහා TEC විසින් සකස් කරන ලද පිරිවිතරයන්ට අනුව, 16GB RAM සඳහන් කර තිබුණි. ඒ අනුව, පරිශීලක අවශ්‍යතාවය TEC විසින් සලකා බලා නොමැති බව නිරීක්ෂණය විය.	අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, උපරිම මතකය 64GB දක්වා වැඩි දියුණු කළ හැකි RAM ඉල්ලා සිටීමට TEC තීරණය කර ඇත. ඒ අනුව, පරිශීලක දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය TEC විසින් සපුරා ඇත.
III.	4.2.8.(v) වගන්තියට අනුව (2023 නොවැම්බර් 01 දින සිට බලපැවැත්වෙන නව අත්පොත) විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමයට අනුව තරඟකාරී ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලංසුකරුවන්ට අවම වශයෙන් දින 14 ක කාලයක් ලබා දිය යුතු වුවද, දින 4 ක් - දින 8 ක් පමණක් ලබා දී ඇති අතර ප්‍රමාණවත් කාල සීමාවක් ලබා දී නොමැත.	අදහස් සටහන් කර ගන්නා ලදී. මූලික මිල ගණන් අවලංගු කර ආපසු කැඳවීමට සිදු වූ බැවින්, අවශ්‍යතාවයෙහි හදිසිභාවය සැලකිල්ලට ගනිමින්, සැපයුම් දෙපාර්තමේන්තුව එම ප්‍රසම්පාදනය සඳහා කෙටි කාලයක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, අනාගතයේදී එවැනි විතැන්වීම් සඳහා සැපයුම් දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය අනුමැතිය ලබා ගැනේ.
IV.	ලබාගත් නියැදිය සමාලෝචනය කිරීමෙන් පසු, ලංසුකරු 32GB හෝ ඊට වැඩි තාවකාලික මතකයකට (RAM) වැඩිදියුණු කළහොත් යන්ත්‍රය අවශ්‍යතාවය සපුරාලන බව පරිශීලක දෙපාර්තමේන්තුව දැනුම් දුන් බව ඉහත සඳහන් EOC පත්‍රිකාවේ සඳහන් වේ. තවද, එක් යෝජනාවක් පමණක් තිබූ බැවින්, TEC විසින් ඒකක මිල පරීක්ෂා කර ඉදිරිපත් කරන ලද මිල අතිශයින් ඉහළ බව නිගමනය කළ බවත්, CIO විසින් විවෘත වෙළඳපොළෙන් මිල ගණන් තුනක් ලබා ගැනීමට උපදෙස් දී ඇති බවත් එහි සඳහන් විය. පරිශීලක අවශ්‍යතාවයට ගැලපෙන පරිදි පිරිවිතර නිසි ලෙස සකස් කර ඇත්නම්, එවැනි ගැටළු සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය ඇති නොවන බව නිරීක්ෂණය විය.	අදහස් සටහන් කර ගන්නා ලදී. අනාගතයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියේ එවැනි ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා මිලදී ගැනීම ආරම්භ කිරීමට පෙර නිසි පිරිවිතරයන් සකස් කිරීම ඇතුළුව ක්‍රියාවලිය විධිමත් කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් නිකුත් කර ඇත.

V.	4.2.13.(v) වගන්තියට අනුව, ලංසු ඇගයීම CM (සැපයුම්) සහ අවම වශයෙන් එක් නිලධාරියෙකු අදාළ දෙපාර්තමේන්තුවෙන් සහිතව 3-II ට වැඩි නිලධාරීන් ඇතුළු 3 දෙනෙකුගෙන් යුත් කමිටුවක් මඟින් සිදු කළ යුතු වේ. ඉහත EOC පත්‍රිකාවේ විද්‍යුත් තැපැල් සඳහා ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කර ඇති බව සඳහන් කර තිබුණද, එවැනි ඇගයීමක් සිදු කර ඇති බව නිරීක්ෂණය නොවීය.	අදහස් සටහන් කර ගන්නා ලදී. ගොඩනැගිලි ඉංජිනේරු දෙපාර්තමේන්තු කටයුතු සිදු කිරීම සඳහා මෙම පරිගණක හදිසි අවශ්‍යතාවයක් විය. එබැවින්, TEC වෙත ඉදිරිපත් නොකර ප්‍රසම්පාදනය අවසන් කරන ලදී. පරිශීලක දෙපාර්තමේන්තුව විසින් ලැබුණු මිල ගණන් පරීක්ෂා කර 32GB හෝ ඊට වැඩි RAM පිළිගත හැකි බව තහවුරු කර ඇත. TEC වෙත ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් සැපයුම් දෙපාර්තමේන්තුව EOC වෙතින් ආවරණ අනුමැතිය ලබාගෙන ඇත.
VI.	රු. මිලියන 1 ට වැඩි සියලුම මිලදී ගැනීම් (භාණ්ඩ, සේවා සහ කොන්ත්‍රාත්තු) සඳහා ක්‍රියා පටිපාටි අත්පොතේ 5.2.8 වගන්තියට අනුව, සාර්ථක ලංසුකරු විසින් භාණ්ඩයේ හෝ සේවාවේ ස්වභාවය අනුව වගකීම් කාලය ආවරණය වන පරිදි නිශ්චිත කාල සීමාවක් සඳහා වලංගු වන බැංකුවට පිළිගත හැකි කාර්ය සාධන බැඳුම්කරයක්/ ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, කාර්ය සාධන බැඳුම්කරයක් ලබා නොගෙන මිලදී ගැනීමේ ඇණවුමක් නිකුත් කර තිබුණි. මෙම ඩෙස්ක්ටොප් පරිගණක දෙක විශේෂිත ස්වභාවයකින් යුක්ත වුවද, අවදානම අවම කිරීම සඳහා වගකීම් කාලය ආවරණය වන පරිදි කාර්ය සාධන බැඳුම්කරයක් ලබා ගැනීමට සැපයුම් දෙපාර්තමේන්තුව සලකා බලා නොමැත.	අදහස් සටහන් කර ගන්නා ලදී. මෙය මිලදී ගැනීමේ හදිසි අවශ්‍යතාවයක් හේතුවෙන් විද්‍යුත් තැපැලෙන් ලැබුණු විවෘත මිල ගණන් කැඳවීමක් බැවින්, බැංකුව විසින් නියමයන් සහ කොන්දේසි සහිත විධිමත් මිල ගණන් ඉල්ලීම ඉදිරිපත් කර නොමැත. එබැවින්, කාර්ය සාධන බැඳුම්කරය ලබාගෙන නොමැති අතර ඒ සඳහා EOC වෙතින් ආවරණ අනුමැතිය ලබාගෙන ඇත.

3.5 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	**කළමනාකරණයේ අදහස**	**නිර්දේශය**
3.5.1 **කාර්ය මණ්ඩල පිරිවැය විශ්ලේෂණය**		කාර්ය මණ්ඩල පිරිවැය ආදායම් උත්පාදනය සමඟ සමපාත කිරීම සහ සමස්ත මෙහෙයුම්
(i) 2024 වර්ෂය සඳහා එක් සේවකයෙකු සඳහා බැංකුව වසරකට රු.මිලියන 4.69	2025 ජූනි 30 වන විට, බැංකුවේ එක් සේවකයෙකුගෙන් ලද ලාභය රු.	

ක පිරිවැයක් දරා තිබුණද, එක් සේවකයෙකු සඳහා උපයන ලද ලාභය රු. මිලියන 3.29 ක් පමණක් බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, අනෙකුත් බැංකු වසරකට එක් සේවකයෙකුට රු. මිලියන 6.17 සිට රු. මිලියන 10.2 දක්වා ලාභයක් වාර්තා කර තිබුණි.	මිලියන 4.85 ක් වූ අතර එය 2024 දී රු. මිලියන 3.29 ක් විය.	කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට බැංකුව එහි මානව සම්පත් කාර්යක්ෂමතාව සහ පිරිවැය කළමනාකරණ උපාය මාර්ග පිළිබඳ ගැඹුරු සමාලෝචනයක් සිදු කිරීම නිර්දේශ කෙරේ.
(ii)2024 වර්ෂය සඳහා බැංකුවේ ශුද්ධ මෙහෙයුම් ආදායමෙන් ප්‍රතිශතයක් ලෙස පුද්ගලික වියදම් සියයට 29.93 ක් වූ අතර එය එම කර්මාන්තයේම අනෙකුත් බැංකු හා සසඳන විට ඉහළම අගය නියෝජනය කරයි. සමාලෝචිත වර්ෂයේ අනෙකුත් බැංකුවල එම අනුපාතය සියයට 14.86 සිට සියයට 19.91 දක්වා පරාසයක පවතී.	2025 ජුනි 30 වන විට, පුද්ගල වියදම් ශුද්ධ මෙහෙයුම් ආදායමෙන් සියයට 26.61 ක් නියෝජනය කළ අතර එය 2024 දී සියයට 29.93 ක් විය. සාමූහික ගිවිසුම්, විශ්‍රාම වැටුප් බැඳීම් සහ බැංකුවේ පුළුල් ශාඛා ජාලයට සහාය වීම සඳහා අවශ්‍ය ඉහළ කාර්ය මණ්ඩල අවශ්‍යතාවය හේතුවෙන් මෙම අනුපාතය සම තත්වයේ පරාසයට වඩා ඉහළින් පවතී. මෙම පරතරය පියවා ගැනීම සඳහා සහ ක්ෂේත්‍රයේ මිණුම් සලකුණු සමඟ පිරිස් වියදම් සකස් කිරීම සඳහා, ශ්‍රම බලකායේ ඵලදායිතාව ඉහළ නැංවීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ප්‍රශස්ත කිරීම අරමුණු කරගත් උපායමාර්ගික පියවර කිහිපයක් මහජන බැංකුව විසින් ආරම්භ කර ඇත.	

4. වගවීම සහ යහපාලනය

විගණන නිරීක්ෂණය	**කළමනාකරණයේ අදහස**	**නිර්දේශය**
I. 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8(1) වගන්තිය අනුව, මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 10 දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, 2025 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන 2024 අංක 05 දරන බැංකු පනතේ මාර්ගෝපදේශ අනුව, බලපත්‍රලාභී බැංකු මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 7 ට නොඅඩු සහ 13 ට නොවැඩි විය යුතුය. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 දිනට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය පිහිටුවා ඇත්තේ අධ්‍යක්ෂවරුන් 5 දෙනෙකුගෙන් පමණි.	බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සුදුසු පත්වීම් ඉල්ලා බැංකුව මුදල් අමාත්‍යාංශයට (MOF) ලිපි කිහිපයක් යවා ඇත. ස්වාධීන අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා අතිවිශේෂ තේරීම් ක්‍රියා පටිපාටිය 2025 ජූලි 31 දක්වා දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇති අතර එය බැංකුවේ පාලනයෙන් ඔබ්බට විය.	අවශ්‍ය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව පත්කර ගැනීම සඳහා අවශ්‍ය පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම සහ උප කමිටු පිහිටුවීමට කටයුතු කරන්න.

II.	මණ්ඩලයට ප්‍රමාණවත් සාමාජිකයින් නොමැති වීම හේතුවෙන් 2024 ඔක්තෝබර් මාසයේ සිට බැංකුව විසින් මණ්ඩල විගණන කමිටුව, මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ මණ්ඩල නාමයෝජනා කමිටුව පවත්වා නොමැත.	2024 සැප්තැම්බර් මාසයේ පැවති ජනාධිපතිවරණයෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩලය නොමැතිවීම සහ බැංකුවේ පාලනයෙන් ඔබ්බට ගිය කරුණු මත ස්වාධීන අධ්‍යක්ෂවරුන් නොමැති වීම හේතුවෙන්, මණ්ඩල විගණන කමිටුව (BAC), මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) සහ මණ්ඩල නාමයෝජනා කමිටුවේ (BNC) රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. කෙසේ වෙතත්, BIRMC රැස්වීම 2025 සැප්තැම්බර් 12 වන දින පවත්වන ලදී.